COMMERCIAL
LEASING & FINANCE

LOLC ෆිනෑන්ස්

Consumer Business Centre
අංක.438, හැව්ලොක් පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව.
පාරිභෝගික සේවා: +94 117716999
වෙබ් අඩවිය: www.clc.lk | www.lolcfinance.com
විද්‍යුත් තැපැල් : CLCCards@lolcfinance.com

# නීතිරීති

# සහ

# කොන්දේසි

## CLC අනුබද්ධිත
## ක්‍රෙඩිට් කාඩ් පත

COMMERCIAL
LEASING & FINANCE

LOLC ෆිනෑන්ස්

**නීතිරීති සහ කොන්දේසි**

**1. අර්ථනිරූපන**

මෙම කොන්දේසි තුළ සන්දර්භය විසින් අවශ්‍ය වන ස්ථානවල දී 'මෙම ගිවිසුම' යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සංස්ථාපිත සමාගමක් වන (ලියාපදිංචි අංක ..... දරණ) මින් මතුවට LOFC යනුවෙන් හැඳින්වෙන (කාඩ්පත් නිකුත්කරු) LOFC ෆිනෑන්ස් පීඑල්සී සහ කාඩ්පත් හිමියා අතර පවතින ගිවිසුම අදහස් වන අතර, කාඩ්පත් හිමියා යන යෙදුමෙහි අර්ථය කලින් කලට වෙනස් වනු ඇත. 'කාඩ්පත' යන්නෙන් මූලික කාඩ්පත් හිමියාට සහ අතිරේක කාඩ්පත් හිමියන්ට නිකුත් කරන ලද ක්‍රෙඩිට් කාඩ්පත් අදහස් වේ. 'මූලික කාඩ්පත් හිමියා' යන්නෙන් යම් අයෙකුගේ නමින් කාඩ්පත් ගිණුමක් පවත්වාගෙන යන්නේ ද එම තැනැත්තා සහ ඔහුගේ/ ඇයගේ උරුමකරුවන් ලැබුම්කරුවන්, පොල්මෑකරුවන් හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන් අදහස් වේ. 'අතිරේක කාඩ්පත් හිමියා' යන්නෙන් මූලික කාඩ්පත් හිමියා විසින් නම් කරන ලද එකී නාමකරණය හේතුවෙන් කාඩ්පත් ගනුදෙනු සිදුකිරීමට අවසරලත් කාඩ්පත්ලාභියෙකු අදහස් වන අතර ඔහුගේ/ ඇයගේ උරුමකරුවන් ලැබුම්කරුවන්, පොල්මෑකරුවන් හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන් ද ඇතුළත් වේ. LOFC හෝ කාඩ්පත් නිකුත්කරු යන්නෙන් LOFC ෆිනෑන්ස් පීඑල්සී සහ එහි ලැබුම්කරුවන් හා අනුප්‍රාප්තිකයින් අදහස් වේ. 'කාඩ්පත් ගිණුම' යන්නෙන් කාඩ්පත් ගනුදෙනු සම්බන්ධයෙන් LOFC විසින් පවත්වාගෙන යන සහ කාඩ්පත් මධ්‍යස්ථානයේ (Card Centre) පවත්වාගෙන යන ගිණුමක් අදහස් වේ. 'කාඩ්පත් මධ්‍යස්ථානය' යන්නෙන් LOFC හි හෝ වෙබ් අඩවියේ පළකර දැනුම් දෙනු ලබන වෙනත් යම් ස්ථානයක පවත්වාගෙන යන කාඩ්පත් අංශය අදහස් වේ.

'කාඩ්පත් හිමියා' යන්නෙන් මෙම ගිවිසුම ප්‍රකාරව LOFC විසින් ක්‍රෙඩිට් කාඩ්පතක් නිකුත් කර ඇති ඕනෑම තැනැත්තෙකු අදහස් වන අතර, එයට මූලික කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියන් ද ඔහුගේ/ඇයගේ උරුමකරුවන් ලැබුම්කරුවන්, පොල්මෑකරුවන් හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන් ද ඇතුළත් වේ. 'කාඩ්පත් ගනුදෙනු' යන්නෙන් භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා යම් අලෙවිකරුවෙකු වෙත කළ යම් ගෙවීමක් හෝ, කාඩ්පත් අංකය භාවිත කරමින් ලබාගත් මුදල් අත්තිකාරම් හෝ ඕනෑම ආකාරයකින් කාඩ්පත් ගිණුම හර කිරීමට කාඩ්පත් හිමියා විසින් අවසර දීමක් හෝ, රහස්‍ය අංකය හෝ වෙනත් යම් කාඩ්පත් තහවුරු කිරීමේ කේත අංකයක් භාවිත කරමින් හෝ, කාඩ්පත් ගනුදෙනුවලට පහසුකම් සලසන වෙනත් යම් අවසරලත් භාරදීමේ හෝ ගෙවීමේ නාලිකාවක් මඟින් සිදුකළ ඕනෑම ගනුදෙනුවක් අදහස් වේ. 'පවුලේ සමීපතම ඥාතියා' යන්නෙන් කාඩ්පත් හිමියාගේ කලත්‍රයා, වයස අවුරුදු 16ට අඩු යැපෙන දරුවන් (අධ්‍යාපන කටයුතු සඳහා) හෝ කාඩ්පත් හිමියාගේ දෙමාපියන් හෝ කාඩ්පත් හිමියාගේ සොහොයුරු සොහොයුරියන් අදහස් වේ. 'අලෙවිකරු' යන්නෙන් කාඩ්පත පිළිගැනීම මත භාණ්ඩ හා සේවා අලෙවිය සඳහා LOFC විසින් පිළිගත් තැනැත්තෙකු හෝ ආයතනයක් අදහස් වේ. 'කාඩ්පත් සීමාව' යන්නෙන් කලින් කලට LOFC විසින් තීරණය කර මූලික කාඩ්පත් හිමියා වෙත දැනුම් දෙන ලද කාඩ්පත් ගිණුම මත අවසර දුන් උපරිම හර සීමාව අදහස් වේ. 'රහස්‍ය අංකය' යන්නෙන් කාඩ්පත් හිමියා වෙත රහස්‍ය ලෙස නිකුත් කරන ලද රහසිගත අංකයක් වන පෞද්ගලික හඳුනාගැනීමේ අංකය අදහස් වේ. 'ගෙවීම් නියමිත දිනය' යන්නෙන් කාඩ්පත් හිමියා විසින් කාඩ්පත භාවිතය මඟින් LOFC වෙත ඔහු/ඇය විසින් ගෙවිය යුතුව පවතින සියලුම හෝ අවම මුදල ගෙවිය යුතු වන දිනය අදහස් වන අතර, එය LOFC විසින් සිය අභිමතය පරිදි තෝරාගන්නා සහ මූලික කාඩ්පත් හිමියා වෙත දැනුම් දෙනු ලබන එක් එක් මාසයේ නිශ්චිත දිනයක් වනු ඇත. 'ඒටීඑම් (ATM) යන්ත්‍ර' යන්නෙන් මුදල් අත්තිකාරම් සඳහා කාඩ්පත භාර ගන්නා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර අදහස් වේ.

**2. කාඩ්පත**

1. කාඩ්පත, LOFC සතු දේපළක් වන අතර, LOFC විසින් ඉල්ලා සිටින අවස්ථාවක දී කාඩ්පත් හිමියා විසින් වහාම භාර දිය යුතු වේ.

2. LOFC විසින් ඕනෑම අවස්ථාවක දී සම්පූර්ණයෙන් හෝ යම් විශේෂිත

**27. අභිමතය**

1. තමන් වෙත පවතින යම් අයිතිවාසිකම් සහ ප්‍රතිකර්මවලට අගති විරහිතව, ඕනෑම අවස්ථාවක දී සිය පූර්ණ අභිමතය පරිදි සහ කිසිඳු හේතු දැක්වීමක් හෝ දැනුම් දීමක් හෝ නොමැතිව, යෝජිත කාඩ්පත් ගනුදෙනුව එයට හර කළහොත් පවතින ශේෂය ණය සීමාව ඉක්මවා නොයාම නොසලකා ඕනෑම යෝජිත කාඩ්පත් ගනුදෙනුවක් අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීමට LOFC වෙත හිමිකම පවතිනු ඇත.

2. මෙම ගිවිසුමෙහි අනෙකුත් ප්‍රතිපාදනවලට අගති විරහිතව සහ ඒවා නොතකා, වර්තමාන ශේෂය ණය සීමාව ඉක්මවා යෑමක් සිදුවන ආකාරයේ කාඩ්පත් ගනුදෙනුවක් සඳහා LOFC විසින් ඉඩදීම හෝ අනුමත කිරීම සිදුකළ හැක.

3. මෙම ගිවිසුමෙහි අනෙකුත් ප්‍රතිපාදනවලට අගති විරහිතව සහ ඒවා නොතකා, ඕනෑම අවස්ථාවක දී එහි පූර්ණ අභිමතය පරිදි දැනුම්දීමකින් තොරව සහ කිසිඳු හේතු දැක්වීමකින් තොරව පහත දෑ සඳහා LOFC වෙත හිමිකම පවතියි.

   (අ) කාඩ්පත සම්පූර්ණයෙන්ම හෝ යම් නිශ්චිත පහසුකම් භාවිතයට ඔබට ඇති අයිතිය අත්හිටුවීම; සහ/හෝ,
   (ආ) ණය සීමාව වැඩිකිරීම හෝ අඩුකිරීම; සහ/හෝ,
   (ඇ) කාඩ්පත නැවත නිකුත් කිරීම, අලුත් කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම ප්‍රතික්ෂේප කිරීම; සහ/හෝ,
   (ඈ) ප්‍රතිලාභ, සේවාවන්, පහසුකම්, වරප්‍රසාද සියල්ල හෝ කිසිවක් හඳුන්වා දීම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම, සීමා කිරීම, අත්හිටුවීම, අවසන් කිරීම හෝ ඉවත් කර ගැනීම සහ නිශ්චිතව ඔබට අදාළව හෝ පොදුවේ සියලු හෝ නිශ්චිත කාඩ්පත් හිමියන් සම්බන්ධයෙන්, කාඩ්පත් ගනුදෙනු සිදුකළ හැකි වන හෝ ඔබට ඔබගේ කාඩ්පත් ගිණුම පිළිබඳ හෝ ඒ සම්බන්ධයෙන් කාඩ්පතෙහි/කාඩ්පත්වල තොරතුරු හෝ ගනුදෙනු විමසිය හැකි නාලිකා එකතු කිරීම හෝ ඉවත් කිරීම.

4. ඔබගේ ඉල්ලීම මත හෝ අප විසින් යෝග්‍ය යැයි සලකන්නේ නම් සහ සලකන අවස්ථාවක දී ඕනෑම අවස්ථාවක කිසිඳු වගකීමක් රහිතව හෝ හේතු දැක්වීමකින් තොරව, සහ ඔබ වෙත දැනුම් දීමක් සහිතව ඔබගේ කාඩ්පත් අංකය වෙනස් කිරීම සහ එම කාඩ්පත් අංකය සඳහා නව කාඩ්පත් ගිණුමක් විවෘත කිරීම සහ/හෝ ප්‍රතිස්ථාපන කාඩ්පතක් නිකුත් කිරීම, සහ වර්තමාන ශේෂයන් හා සියලු බැර (තිබේ නම්) ඔබගේ මුල් කාඩ්පත් ගිණුමෙන් නව කාඩ්පත් ගිණුම වෙත මාරු කිරීම LOFC විසින් කළ හැකිය. අප විසින් ඔබ වෙත එවැනි දැනුම්දීමක් ලබා දීමෙන් පසුව, ඔබ විසින් වහාම පැරණි කාඩ්පත කැබලි දෙකකට හෝ වැඩි ගණනකට කපා, අප වෙත ආපසු භාර දිය යුතු වේ.

5. ඔබගේ කාඩ්පත් ගිණුමෙහි සිදුවන එවැනි වෙනසක් මඟින් මෙම ගිවිසුම යටතේ ඔබගේ බැඳීම් සහ වගකීම්වලට කිසිඳු බලපෑමක් හෝ අගතියක් සිදු නොවනු ඇති අතර, මෙම ගිවිසුම සහ ඔබගේ පෙර කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් ඔබ විසින් අප වෙත ලබා දී ඇති ඍජු හර අවසර දීමේ උපදෙස් නව කාඩ්පත් ගිණුමට අඛණ්ඩව අදාළ වනු ඇති අතර, ඔබ විසින් අන් ආකාරයකට අප වෙත ලිඛිතව දැන්වුවහොත් හැර අප විසින් අඛණ්ඩව එම හර කිරීම් සිදු කරනු ඇත.

කිරීමේ කාඩ්පතකින් (EFTC) විදේශ මුදල් වලින් සිදු කරන ඉහත 2(අ) ඡේදයේ විෂය පථයෙන් පිටතට වැටෙන ඕනෑම ගනුදෙනුවක් සඳහා වන ගෙවීමක් සඳහා විනිමය පාලක තැනගේ පූර්ව ලිඛිත අවසරය අවශ්‍ය වනු ඇත.

3. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම නිවේදනයේ කාර්යය සඳහා 'විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත' (EFTC) යන්නෙන් බැර, හර හෝ වෙනත් යම් ආකාරයක වටිනාකමක් මාරු කිරීම සඳහා භාවිත කරන්නාට හැකියාව ලබාදෙන කාඩ්පතක් හෝ උපකරණයක් අදහස් වන අතර, එයට ක්‍රෙඩිට් කාඩ්පත්, ඩෙබිට් කාඩ්පත් සහ විනිමය පාලන පනතේ විධි විධානයන්ට අනුකූල වන බවට බලයලත් වෙළෙඳුන් විසින් ගනුදෙනු විස්තර හඳුනාගත හැකි අවස්ථාවල දී වටිනාකම තැන්පත් කළ කාඩ්පත් ද ඇතුළත් වේ. "පෞද්ගලික භාවිතය යන්නෙන් කාඩ්පත් හිමියාගේ, ඔහුගේ/ඇයගේ කලත්‍රයාගේ, ළමයින්ගේ සහ දෙමාපියන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිත කිරීම අදහස් වන අතර එමඟින් කාඩ්පත යම් වාණිජ කාර්යයක් සඳහා භාවිත කිරීම අදහස් නොවේ.

උපුටා ගැනීම අවසන්

## 26. දුරකථන, ටෙලෙක්ස්, ෆැක්ස් හා විද්‍යුත් තැපෑල මඟින් ලබාදෙන උපදෙස් සඳහා අවසර දීම හා හානිපූරණය

1. උපදෙස් ලබා දෙන හෝ ලබා දෙන්නේ යයි උද්දේශිත පුද්ගලයාගේ බලය හෝ අනන්‍යතාවය සම්බන්ධයෙන් කාඩ්පත් නිකුත්කරු විසින් කිසිඳු පරීක්ෂාවක් නොකර, එසේ උපදෙස් ලැබෙන අවස්ථාව වන විට පවතින තත්ත්වයන් නොසලකා, කාඩ්පත් හිමියා හෝ ඔහු/ඇය වෙනුවෙන් දුරකථන, ටෙලෙක්ස්, ෆැක්ස් හෝ විද්‍යුත් තැපෑල මඟින් වරින් වර ලබාදෙන හෝ ලබා දුන්නේ යෑයි උද්දේශිත දැන්වීම්, උපදෙස්, ඉල්ලීම් හෝ වෙනත් පණිවුඩ ('උපදෙස්') මත විශ්වාසය තැබීමට හා ඊට අනුකූලව ක්‍රියා කිරීමට කාඩ්පත් හිමියා කාඩ්පත් නිකුත්කරුට අවසර දී සිටියි. උපදෙස් ලැබීමේ දිනය/වේලාව සම්බන්ධයෙන් කාඩ්පත් නිකුත්කරුගේ තීරණය අවසානාත්මක බවට කාඩ්පත් හිමියා පිළිගනු ඇත.

2. කාඩ්පත් හිමියා විසින් උපදෙස් සඳහා සම්පූර්ණයෙන් බලය ලබා දී ඇතැයි සැලකීමටද එමඟින් කාඩ්පත් හිමියා බැඳී සිටින බවටද සැලකීමටද කාඩ්පත් නිකුත්කරුට අයිතිය ඇති අතර, එම උපදෙස් මුදල් ගෙවීම සඳහා හෝ නැති නම් යම් ගිණුමක් හර කිරීමට හෝ බැර කිරීමට හෝ යම් මුදලක් හෝ ලියවිල්ලක් බැහැර කිරීමට හෝ, කාඩ්පත් හිමියා කාඩ්පත් නිකුත්කරු සමග හෝ වෙනත් පුද්ගලයෙකු සමග කිසියම් ගිවිසුමකට හෝ වෙනත් සැලසුමකට උද්දේශිතව බැඳීමට හෝ කාඩ්පත් හිමියා වෙනත් ඕනෑම ආකාරයක ගනුදෙනුවකට හෝ සැලසුමකට යොමු කිරීමකට හෝ වුවද, එම ගනුදෙනුවේ හෝ සැලසුමේ ස්වභාවය හෝ ඊට සම්බන්ධ මුදල් ප්‍රමාණය නොසලකා, එම උපදෙස්වල වැරදි, දුරවබෝධතා, වරදවා වටහා ගැනීම් හෝ පැහැදිලි බව අඩු වීම නොසලකා, එම උපදෙස් මත විශ්වාසය තබා හෝ ඒ සම්බන්ධයෙන් කාඩ්පත් නිකුත්කරු සුදුසු යැයි සිතන ආකාරයට පියවර ගැනීමට කාඩ්පත් නිකුත්කරුට අයිතිය ඇත.

3. මෙම අවසර ලබා දීමේ හා වන්දි පූරණ නීතිරීතිවලට අනුකූලව කාඩ්පත් නිකුත්කරු ක්‍රියාකිරීමට සලකා, කාඩ්පත් හිමියා මෙමඟින් ආපසු හැරවිය නොහැකි ලෙස කාඩ්පත් නිකුත්කරු වන්දි පූරණය කිරීමටද, උපදෙස් සම්බන්ධයෙන් හෝ එම උපදෙස්වලින් ඕනෑම ස්වභාවයකින් හා ඕනෑම ආකාරයකින් උද්ගත වන්නා වූ, කාඩ්පත් නිකුත්කරුට දරන්නට සිදුවන සියලු පාඩු, අයැදීම්, නඩු, ක්‍රියාමාර්ග, ඉල්ලීම්, පිරිවැය හා වියදම් සඳහා කාඩ්පත් නිකුත්කරු වන්දි පූරණය කිරීමට කාඩ්පත් හිමියා මෙමඟින් භාර ගනියි.

පහසුකමක් සම්බන්ධයෙන් හෝ එහි පූර්ණ අභිමතය පරිදි පෙර දැනුම් දීමකින් හෝ හේතුවකින් තොරව කාඩ්පත හා එය භාවිත කිරීමට ඇති කාඩ්පත් හිමියාගේ අයිතිය අවලංගු කිරීම හෝ අත්හිටුවීම හෝ ඉවත් කර ගැනීම කළ හැකි අතර, අඛණ්ඩව බලාත්මකව පවතිනු ඇති මෙම ගිවිසුම යටතේ කාඩ්පත් හිමියාට පවතින බැඳීම්වලට කිසිඳු බලපෑමකින් තොරව කාඩ්පත නැවත නිකුත් කිරීම, අලුත් කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම ප්‍රතික්ෂේප කළ හැකිය. කාඩ්පත් හිමියා ස්වේච්ඡාවෙන් කාඩ්පත ආපසු භාර දෙන අවස්ථාවක දී මෙම ගිවිසුම යටතේ ඇති බැඳීම් මේ යටතේ ඇති කාඩ්පත් හිමියාගේ එම සියලු බැඳීම් කාඩ්පත් හිමියා විසින් LOFC සෑහීමකට පත්වන අයුරින් ඉටුකරන තෙක් අඛණ්ඩව බලාත්මකව පවතිනු ඇත.

## 3. කාඩ්පත සහ පෞද්ගලික හඳුනාගැනීමේ අංකය (රහසය අංකය) භාරදීම හා භාවිතය

1. කාඩ්පත ලද වහාම එහි පිටුපස කාඩ්පත් හිමියා විසින් තම අත්සන තැබිය යුතු අතර, එහි ණය සීමාව තුළ (ණය සීමාව ඉක්මවා යන යම් මුදලක් වහාම LOFC වෙත ගෙවිය යුතු වේ) මෙම ගිවිසුමෙහි නීතිරීතිවලට යටත්ව කාඩ්පත් හිමියා විසින් භාවිත කළ යුතු වන අතර, වෙනත් පුද්ගලයෙකුට එය භාවිත කිරීමට අවසර නොදිය යුතු වේ. කාඩ්පත් හිමියා විසින් සෑම විටම කාඩ්පත ආරක්ෂා කළ යුතු අතර එය කාඩ්පත් හිමියාගේ භාරයේ තබාගත යුතු වේ.

2. කාඩ්පත්, කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) (මින් මතු දක්වා ඇති පරිදි) වෙත දූත මාර්ගයෙන් යවනු බලන අවස්ථාවක දී කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා වෙත එම කාඩ්පත (කාඩ්පත්) ලැබුණු විට ඔහු/ ඇය එය ලද බව වහාම දැන්විය යුතු අතර ඔහුගේ/ඇයගේ අනන්‍යතාවය තහවුරු කළ යුතුය. කාඩ්පත් හිමියාට/ අතිරේක කාඩ්පත් හිමියාට ඔහුගේ/ඇයගේ අභිමතය පරිදි ඔහු/ඇය වෙනුවෙන් කාඩ්පත(පත්) භාරගැනීමට ලිඛිතව තුන්වන පාර්ශ්වයක් පත්කළ හැකි අතර, කාඩ්පත් හිමියා/අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) හෝ ඔහු/ඇය වෙනුවෙන් බලයලත් පුද්ගලයා විසින් එම කාඩ්පත භාරගත් මොහොතේ පටන් කාඩ්පත මත සිදුකෙරෙන වියදම් සඳහා වගකීමට යටත් වේ. LOFC විසින් එහි අභිමතය පරිදි LOFC විසින් හෝ එහි නියෝජිතයෙකු විසින් කාඩ්පත් හිමියාගේ නියෝජිතයෙකු යැයි නිශ්චය කරන පුද්ගලයෙකු වෙත කාඩ්පත භාරදිය හැකිය. එසේ කාඩ්පත (කාඩ්පත්) භාර දුන් මොහොතේ පටන් කාඩ්පත සම්බන්ධ අයකිරීම් සඳහා කාඩ්පත් හිමියා/අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) වගකීමට යටත් වේ.

3. LOFC හි අභිමතය පරිදි, කාඩ්පත සඳහා වන රහසය අංකය (PIN) කාඩ්පත් හිමියා/ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) වෙත LOFC හි දී නිකුත් කිරීම හෝ භාරදීම හෝ ලියාපදිංචි තැපෑල හරහා ලබාදීම හෝ දූත සේවාවක් හරහා භාරදීම සිදුකරනු ඇත. එය භාර දී නොමැති බවට, සාධාරණ කාලසීමාවක් තුළ, අදාළ වන පරිදි තැපැල් දෙපාර්තමේන්තුවෙන් හෝ දූත සේවාවෙන් LOFC වෙත කිසිඳු දැන්වීමක් නොලැබුණහොත් කාඩ්පත් හිමියා/අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) වෙත එය ලැබී, ඔහු/ඇය විසින් එය භාරගත්තේ යැයි සැලකේ. රහසය අංකය, ලබා ගැනීමෙන් පසු එය කාඩ්පත් හිමියා/ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) සතු දේපළක් වන අතර, පුද්ගලික හඳුනාගැනීමේ අංකය සුරක්ෂිතව තබා ගැනීම සඳහා සහ කිසිඳු ආකාරයකින් අන්සතු නොවීමට අවශ්‍ය සෑම පූර්වාරක්ෂක ක්‍රියාමාර්ගයක් ගන්නා බවට කාඩ්පත් හිමියා සහතික විය යුතු වේ.

4. කාඩ්පත් හිමියා/ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) විසින් ගනුදෙනු/වක් සිදුකර ඇති බවට විශ්වාස කිරීමට LOFC වෙත හේතුසාධක පවතින අවස්ථාවක දී මතභේදයට පත් යම් ගනුදෙනු(වක) අගය ඊට සම්බන්ධ ගාස්තු ද සමග කාඩ්පත් හිමියා වෙතින් අයකර ගැනීමට LOFC අයිතිය රඳවා ගනියි.

5. කාඩ්පත කිසිඳු නීති විරෝධී හෝ නීත්‍යානුකූල නොවන කාර්යයක් සඳහා භාවිත නොකළ යුතු වේ.

6. කාඩ්පතෙහි මුද්‍රිත නෙරුම මඟින් දක්වා ඇති වලංගු කාලසීමාව තුළ පමණක් කාඩ්පත භාවිත කළ යුතු වේ.

7. කාඩ්පත් හිමියා විසින් කිසිඳු ඉඩමක් හෝ දේපල මිලදී ගැනීම සඳහා, මාසික වාරික ගෙවීම සඳහා හෝ විනිමය පාලන රෙගුලාසි පනතේ, නියමයන් හෝ මග පෙන්වීම්වල දක්වා ඇති ආකාරයට වෙනත් ප්‍රාග්ධන ගනුදෙනු සඳහා කාඩ්පත භාවිත නොකළ යුතු වේ.

**4. ණය සීමාව**

1. LOFC විසින් කාඩ්පත් ගිණුමට ණය සීමාවක් පනවනු ඇති අතර, කාඩ්පත් හිමියා විසින් එය දැඩි ලෙස පිළිපැදිය යුතු අතර, ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ ණය සීමාව ප්‍රතිශෝධනය කරන ලෙස අයදුම් කළ හැකිය. ණය සීමාව ඉක්මවා ගොස් ඇතිදැයි ගණනය කිරීමේ දී LOFC විසින් තවමත් කාඩ්පත් ගිණුමට බැර කර නොමැති යම් කාඩ්පත් ගනුදෙනුවක මුදල සහ අනාගත කාඩ්පත් ගනුදෙනුවක් සම්බන්ධයෙන් LOFC විසින් තෙවන පාර්ශ්වයක් වෙත ලබා දී ඇති යම් අවසර දීමක ගිණුම් ශේෂය හෝ ඔබ විසින් සිදුකළ ඉල්ලීමක් මත ඉදිරියේ එන ගනුදෙනුවක් සඳහා LOFC විසින් අවුරා තබා ගෙන ඇති යම් මුදලක් ද සලකා බලනු ඇත.

2. මෙම ගිවිසුම අවසන් කළ ද ඒ බව නොතකා, කාඩ්පත සම්බන්ධයෙන් LOFC විසින් පිරිනමා ඇති සියලුම ණයවර පහසුකම් සඳහා සහ ඒ යටතේ වන අදාළ සියලු ගාස්තු සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු වනු ඇත.

**5. කාඩ්පත් ගිණුම**

1. LOFC හට දරන්නට සිදුවන නීතිමය ගාස්තු සහ වෙනත් සියලු පරිපාලන පිරිවැය සහ කාඩ්පත භාවිතයෙන් පැනනගින LOFC හට දරන්නට සිදුවන පාඩු ද ඇතුළත්ව, සියලුම කාඩ්පත් ගනුදෙනු, ඊට අදාළ ගාස්තු සහ කාඩ්පත් හිමියාගේ වෙනත් වගකීම්වල මුදල් LOFC විසින් කාඩ්පත් ගිණුමෙන් හර කරනු ඇත.

2. අලෙවි හෝ මුදල් අත්තිකාරම් වවුචර කාඩ්පත් හිමියා විසින් අත්සන් කර තිබුණද නොතිබුණද, හර කරනු ලබන සියලුම මුදල් LOFC වෙත ගෙවීමට කාඩ්පත් හිමියා වගකීමෙන් බැඳී සිටියි.

3. LOFC විසින් මාසික ගිණුම් ප්‍රකාශනයක් මූලික කාඩ්පත් හිමියා වෙත අයදුම්පතෙහි දක්වා ඇති ලිපිනයට හෝ ගෙවීම් නියමිත දිනට අවම වශයෙන් දින හතකට (07) පමණ පෙර ලිඛිතව නිසි ලෙස දන්වා ඇති වෙනත් යම් ලිපිනයකට යවනු ඇත.

4. කාඩ්පත් හිමියා විසින් අවම වශයෙන් අවම ගෙවීම හෝ ගෙවීම් නියමිත දිනයට ගෙවිය යුතු වේ. අවම ගෙවීම කාඩ්පත් හිමියාගේ මාසික ගිණුම් ප්‍රකාශයේ දක්වා ඇති සමස්ත හිඟ මුදලින් 5%ක් හෝ ශ්‍රීලංරු 100ක් යන දෙක අතරින් ඉහළ අගයෙන් යුතු මුදල වනු ඇති අතර, සමස්ත හිඟ මුදල කාඩ්පත් හිමියාගේ ණය සීමාව ඉක්ම වන්නේ නම්, ණය සීමාවෙන් 5%ක් සමග ණය සීමාව ඉක්මවන මුළු හිඟ මුදල සමග වේ. පෙර බිල්ගත කිරීම් කාලසීමාවක (කාලසීමාවල) නොගෙවා ඇති ගෙවීමට නියමිත අවම ගෙවීම් සහ බිල්ගත කිරීමේ තුළ අය කරන ලද සමාන මාසික වාරික මිලදී ගැනීම් වේ නම් ඒවාද අවම ගෙවීමට එකතු කරනු ඇත.

5. මූලික කාඩ්පත් හිමියා බුන්වත්භාවී ක්‍රියාවක් සිදුකිරීම මත හෝ ඔහුගේ මරණය මත හෝ, කාඩ්පත් හිමියා විසින් මෙම ගිවිසුම කඩ කිරීමක් සිදුකළහොත් හෝ LOFC හි අභිමතය මත මෙම ගිවිසුම යටතේ ගෙවිය යුතු සියලුම මුදල් සම්පූර්ණයෙන් ගෙවිය යුතු වනු ඇත.

2. වාණිජ පරිමාණයෙන් භාණ්ඩ ආනයනය කිරීම සඳහා වන ගෙවීම් සහ ප්‍රාග්ධන ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියා විසින් කාඩ්පත (කාඩ්පත්) භාවිත නොකළ යුතුය.

3. කාඩ්පත් හිමියා වෙනත් රටකට සංක්‍රමණය වන විට, විදේශ රැකියාවකට ශ්‍රී ලංකාව හැරයන විට, හෝ අදාළ කාලයේ බලපැවැත්වෙන විනිමයපාලන රෙගුලාසිවල නිර්වචනය යටතේ 'අනේවාසික' යැයි සැලකෙන අවස්ථාවක දී කාඩ්පත් හිමියා සිය කාඩ්පත(පත්) LOFC වෙත භාරදිය යුතුය.

4. කලින් කලට පනවන ආකාරයට, විනිමය පාලක හෝ වෙනත් ඕනෑම නියාමන බලධාරියෙකු විසින් කලින් කලට නියම කරන පරිදි වාර්තා කිරීමේ අවශ්‍යතාවයන්ට අනුකූලව කාඩ්පත් නිකුත්කරු ක්‍රියාකරනු ඇත.

5. අදාළ අවස්ථාව වන විට බලපැවැත්වෙන විනිමය පාලන රෙගුලාසි උල්ලංඝනය කිරීමක් සිදුව ඇතැයි කාඩ්පත් නිකුත්කරුට විශ්වාස කිරීමට යම් හේතුවක් ඇත්නම්, කාඩ්පත් නිකුත්කරු විසින් කාඩ්පත් හිමියා(හිමියන්)ට පෙර දැනුම් දීමකින් තොරව සිය අදහස පරිදි කාඩ්පත(පත්) අවලංගු කරනු ඇත. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016.01.20 දිනැති අංක 1950/40 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයට යටත්ව විදේශ විනිමය මඟින් සිදු කෙරෙන ගනුදෙනු සඳහා කාඩ්පත යොදාගත හැකිය.

උපුටා ගැනීම

1. යම් තැනැත්තෙකු විසින් සිය විද්‍යුත් මුදල් මාරුකිරීමේ කාඩ්පතක් භාවිතයෙන් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට විදේශ ව්‍යවහාර මුදල්වලින් ගෙවීම් කිරීම සඳහා විනිමය පාලන පනතේ (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරය වූ) 7 වන සහ 8 වන වගන්තිවල කාර්ය සඳහා පහත දැක්වෙන නියමයන් හා කොන්දේසිවලට යටත්ව මෙයින් අවසර දෙනු ලැබේ.

2. (අ) ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන තැනැත්තෙකු හෝ ආයතනයක් වෙත විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් (EFTC) මඟින් සිදුකරන ගෙවීමක් පහත දැක්වෙන කාර්යයන් සඳහා පමණක් සිදු කළ හැකිය.
   i. සංචාරක, නවාතැන්, වෛද්‍ය පහසුකම්, ජීවන හා අධ්‍යාපන වියදම් ඇතුළු පෞද්ගලික ස්වභාවයේ සේවා සඳහා කාඩ්පත් හිමියකු විසින් විදේශ රටවලදී මුදල් ගෙවීම.
   ii. පෞද්ගලික ප්‍රයෝජනය සඳහා විදේශ රටවලදී භාණ්ඩ මිලදී ගැනීම සඳහා මුදල් ගෙවීම.
   iii. එක් භාණ්ඩ ඇණවුමකට ඇමෙරිකානු ඩොලර් 3,000 ක (පිරිවැය, රක්ෂණ සහ ගැල්කුලිය - c.i.f.) හෝ වෙනත් මුදල් වර්ගයකින් ඊට සමාන සීමාවක යටත්ව පෞද්ගලික ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම සඳහා මුදල් ගෙවීම.
   iv. විදේශීය වෘත්තිමය ආයතනයකට හෝ අධ්‍යාපනික ආයතනයකට ගෙවිය යුතු පෞද්ගලික ස්වභාවයේ ලියාපදිංචි වීමේ ගාස්තු, අමතර ඉගැන්වීමේ ගාස්තු, විභාග ගාස්තු සහ වාර්ෂික දායක මුදල් ගෙවීම.
   v. පෞද්ගලික ස්වභාවයේ සංචාරක සහ සෞඛ්‍ය රක්ෂණ සඳහා පමණක් රක්ෂණ වාරික සම්බන්ධයෙන් මුදල් ගෙවීම.

(ආ) ශ්‍රී ලංකාව තුළ නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතකින් (EFTC) මුදල් ගෙවීම එම කාඩ්පත විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමකට (FEE), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට (RFC), නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට (RNNFC) හා අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට (NRFC) එදිරිව නිකුත් කර ඇති අවස්ථාවක දී හැර විද්‍යුත් මුදල් මාරු

5. දෙපාර්ශවයෙන් එක් පාර්ශවයක් විසින් මෙම ගිවිසුම අවසන් කිරීම නොතකා, කාඩ්පත භාවිත කිරීම මඟින් ඇතිවන සියලුම වැඩිදුර අය කිරීම් සඳහා කාඩ්පත් හිමියා අඛණ්ඩව වගකිව යුතු වනු ඇත.

## 22. පාලනය වන නීතිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පවතින නීතිවලට අනුකූලව මෙම ගිවිසුම පාලනය වීම සහ අර්ථ නිරූපනය වීම සිදු කෙරෙනු ඇත. නීතිය මඟින්, රජයේ රෙගුලාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ උපදෙස් මඟින් සංශෝධනයන් අවශ්‍ය වුවහොත් මෙම නීතිරීති සහ කොන්දේසි ස්වයංක්‍රීයවම සංශෝධන වනු ඇත. ඔබගේ කාඩ්පත සහ කාඩ්පත් ගිණුම භාවිත කළ යුත්තේ වලංගු හා නීත්‍යානුකූල අරමුණු සඳහා පමණි. කාඩ්පත් හිමියා වෙනත් අරමුණක් සඳහා කාඩ්පත භාවිත කළහොත් හෝ වෙනත් අයෙකුට භාවිත කිරීමට ඉඩදුනහොත් හෝ එකී භාවිතය සඳහා ඔබ වගකිව යුතු වන අතර, එවැනි භාවිතයක ඵලයක් ලෙස කාඩ්පත් නිකුත්කරු, මාස්ටර්කාඩ් ඉන්ටනැෂනල් (MasterCard International) හෝ කාඩ්පත මෙහෙයවීම සම්බන්ධයෙන් කාඩ්පත් නිකුත්කරු විසින් ගිවිසුමකට එළඹ ඇති එවැනි වෙනත් යම් ආයතනයක් විසින් ගෙවන සියලු මුදල් හෝ වියදම් කාඩ්පත් නිකුත්කරු හෝ සහ මාස්ටර්කාඩ් ඉන්ටනැෂනල් හෝ එවැනි වෙනත් යම් ආයතනයක් හෝ වෙත මුදල් පියවීමට නියම කෙරෙනු ඇත.

## 23. වරද

කිසියම් කාඩ්පත් හිමියෙකු විසින් ශ්‍රී ලංකාවේ නීතිවලට පටහැනි වන හෝ ශ්‍රී ලංකාවේ නීති යටතේ වරදක් ලෙස සැලකෙන යම් ආකාරයකින් හෝ යම් කාර්යයක් සඳහා කාඩ්පත භාවිත කළහොත්, LOFC විසින්, එහි පූර්ණ අභිමතය පරිදි වහාම ක්‍රියාත්මක වන පරිදි මෙම ගිවිසුම ඒකපාර්ශ්විකව අවසන් කර කාඩ්පත් හිමියා වෙත නිකුත් කර ඇති සියලු කාඩ්පත් අවලංගු කිරීම කළ හැකි වේ. එවැනි නීතිවිරෝධී ක්‍රියාකාරකම්/ගනුදෙනු සම්බන්ධ සියලු තොරතුරු LOFC විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කළ හැකිය.

## 24. කාලාවරෝධය බැහැර කිරීම

කාඩ්පත් ගිණුමෙහි යම් මුදලක් හෝ ඉන් කොටසක් හෝ කාඩ්පත් නිකුත්කරු වෙත ගෙවිය යුතුව හිඟව පවතිනතාක් කාඩ්පත් හිමියා /හිමියන් විසින් දැනටමත් කාඩ්පත් නිකුත්කරු වෙත ගෙවා නොමැති මුදල් හෝ එය ගෙවීම සඳහා වන කාඩ්පත් හිමියාගේ/හිමියන්ගේ සහ ඔවුන් එකිනෙකාගේ වගකීම්වලින් කිසිවක් පවතිනු ඇති අතර, ඊට පටහැනිව මෙහි හෝ වෙනත් නෛතික හෝ සාධාරණත්ව රීතියක හෝ කාලාවරෝධී ආඥා පනතෙහි හෝ වෙනත් යම් ව්‍යවස්ථාවක කිසිවක් සඳහන් වුවද ඉහත කී පරිදි කාඩ්පත් නිකුත්කරු වෙත ගෙවිය යුතුව ඇති මුදල් හෝ ඉන් කොටසක් හෝ කාඩ්පත් හිමියා/හිමියන් වෙතින් සහ එක් එක් කාඩ්පත් හිමියන් වෙතින් එක්ව සහ වෙන් වෙන්ව අය කරගත හැකිවනු ඇති අතර, එය ඔවුන්ගේ වගකීමක්ව පවතිනු ඇති බවට කාඩ්පත් හිමියා/හිමියන් එකඟ වන අතර, මෙහි සඳහන් කර ඇති මුදල් හෝ ඉන් යම් කොටසක් හෝ අයකරගැනීම සඳහා කාඩ්පත් හිමියා/හිමියන් හෝ කාඩ්පත් හිමියන්ගෙන් කිසිවෙකු කාඩ්පත් නිකුත්කරු විසින් කාඩ්පත් හිමියා/හිමියන්ට හෝ කාඩ්පත් හිමියන්ගෙන් කිසිවෙකුට නඩු පැවරීමට බාධකයක් ලෙස කාලාවරෝධී ආඥාපනත හෝ එහි ප්‍රතිපාදනවලින් කිසිවක් හෝ වෙනත් යම් රීතියක් හෝ ව්‍යවස්ථාවක් හෝ වෙනත් නීතියක් අයැදීම නොකරන බවට කාඩ්පත් හිමියා/හිමියන් මෙමඟින් වැඩිදුරටත් එකඟ වේ.

## 25. විනිමය පාලන රෙගුලාසි

1. කාඩ්පත් හිමියා සෑමවිටම ඔහු/ඇය, විනිමය පාලන පනතෙහි ප්‍රතිපාදන සහ ඒ යටතෙහි පනවා ඇති මෙහෙයුම් උපදෙස් හා රෙගුලාසිවලට අනුකූලව කාඩ්පත (කාඩ්පත්) භාවිත කරන බවට වගබලාගත යුතු වේ.

6. LOFC වෙත ගෙවන ලද යම් ගෙවීමක් බලාත්මක වනු ඇත්තේ එය ලැබී කාඩ්පත් ගිණුම වෙත බැර කළ පසුව පමණකි. මුදලින් සිදුකළ ගෙවීම් සැකසීම සඳහා අවම වශයෙන් එක් වැඩ කරන දිනයක් අවශ්‍ය වන අතර, චෙක්පත් මඟින් සිදුකරන ගෙවීම් උපලබ්ධි වීමට යටත්ව කාඩ්පත් ගිණුමට බැර කෙරෙනු ඇත.

## 6. බිල්ගත කිරීම් හා ගෙවීම්

1. සෑම බිල්පත් කාලසීමාවකම අවසානයේ දී ප්‍රකාශන දිනයේදී මාසිකව (LOFC විසින් සිය අභිමතය පරිදි එක් එක් මාසයේ තෝරාගන්නා නිශ්චිත දිනයකදී) පොලී ගණනය කිරීමේ කාර්යය සඳහා සහ ගෙවීම් නියමිත දිනය දැක්වීම සඳහා මූලික කාඩ්පත් හිමියා වෙත ගිණුම් ප්‍රකාශනයක් යවනු ඇත. මාසික ගිණුම් ප්‍රකාශනයෙහි, මූලික සහ/හෝ අතිරේක කාඩ්පත් හිමියන් විසින් බිල්පත් කාලසීමාව තුළ සිදුකළ ගනුදෙනු පිළිබඳ විස්තර, පෙර ගිණුම් ප්‍රකාශනයෙන් ඉදිරියට ගෙන ආ හිඟ මුදල, කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ලැබුණු ගෙවීම්, බිල්පත් කාලසීමාව අවසානයේ දී කාඩ්පත් ගිණුමේ මුළු හිඟ මුදල (සමස්ත හිඟ මුදල) පිළිබඳව සහ සමස්ත හිඟ මුදලින් ගෙවීම් නියමිත දිනය වනවිට කාඩ්පත් හිමියා විසින් අදාළ බිල්පත් කාලසීමාව සඳහා ගෙවිය යුතු අවම මුදල පිළිබඳ විස්තර අඩංගු වනු ඇත.

2. මූලික කාඩ්පත් හිමියා වෙත මාසික ගිණුම් ප්‍රකාශනය නොලැබුණහොත්, ඔහු/ඇය වෙත මාසික ගිණුම් ප්‍රකාශනය ලැබී නොමැති බවට බිල්පත් කාලසීමාව අවසන් වී දින 10ක් තුළ ඒ බව LOFC කාඩ්පත් මධ්‍යස්ථානය වෙත දැනුම්දීම ඔහුගේ/ඇයගේ වගකීමක් වනු ඇත.

3. මාසික ගිණුම් ප්‍රකාශනය නොලැබීම කාඩ්පත් හිමියා ඔහුගේ/ඇයගේ වගකීම්වලින් නිදහස්වීමට හේතුවක් නොවේ.

4. කාඩ්පත් හිමියා විසින් LOFC වෙත කාඩ්පත් ගිණුම් සම්බන්ධයෙන් සිදුකරන ලද ගෙවීම්, LOFC වෙත පවතින කාඩ්පත් හිමියාගේ වගකීම් ගෙවීම සඳහා කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ලැබුණු පසුව මෙම නීතිරීති සහ කොන්දේසි යටතේ LOFC විසින් තීරණය කරනු ලබන පිළිවෙලකට ආදේශ කරනු ඇත.

5. කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් නිකුත් කරන ලද එක් එක් ගිණුම් ප්‍රකාශන කාඩ්පත් හිමියා විසින් පරීක්ෂා කර බලා, කිසියම් වරදක් ඇතොත් ඒ බව, ප්‍රකාශන දිනයෙන් දින 14ක් ඇතුළත LOFC කාඩ්පත් මධ්‍යස්ථානය වෙත දැනුම්දිය යුතුය. යම් වරදක් සම්බන්ධයෙන් දින 14ක කාලසීමාවක් තුළ දැනුම්දීමට කාඩ්පත් හිමියා අපොහොසත් වන්නේ නම්, එම කාලසීමාවෙන් පසුව ප්‍රකාශනය හා එහි අඩංගු කරුණු කාඩ්පත් හිමියා මත බන්ධනීය වනු ඇති අතර, එහි අන්තර්ගතය පිළිබඳව අවසානාත්මක සාධකයක් වශයෙන් සැලකෙනු ඇති අතර, කාඩ්පත් හිමියා ඉන් අනතුරුව එකී ගිණුම් ප්‍රකාශනයේ අන්තර්ගතය සම්බන්ධයෙන් හබ නොකළ යුතු වේ. මූලික කාඩ්පත් හිමියා විසින් LOFC වෙත ලිඛිතව ලබාදී ඇති අවසාන ලිපිනය වෙත සියලුම ප්‍රකාශන තැපෑලෙන් එවනු ලබන අතර, තැපැල් කිරීමෙන් පැය හතළිස් අටක් (48) ඇතුළත එය ලැබෙනු ඇතැයි සැලකෙනු ඇත. කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් වන කිසියම් පැමිණිල්ලක් වේ නම්, එය LOFC ක්ෂණික ඇමතුම් අංකය ඔස්සේ හෝ ලිඛිතව කාඩ්පත් මධ්‍යස්ථානය වෙත දැනුම්දිය යුතු වේ.

6. ගෙවීමේ මුදල් වර්ගය සහ ගිණුමේ මුදල් වර්ගය මත පදනම්ව, කාඩ්පත් හිමියාගේ LOFC වෙත පවතින වගකීම ශ්‍රී ලංකා රුපියල්වලින් පවතින බවට වන පදනමින්, විදේශීය ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමේ අවස්ථාවකදී හෝ ශ්‍රී ලංකා රුපියල් විදේශීය ව්‍යවහාර මුදල් වර්ගයකට ප්‍රති-හුවමාරු කිරීමේ හෝ අදාළ පරිදි අනෙක් අවස්ථාවකදී තීරණය කෙරෙන හෝ ආදේශ කෙරෙන අදාළ විනිමය හුවමාරු හෝ ප්‍රති-හුවමාරු අනුපාත කාඩ්පත් හිමියා සහ LOFC අතර අවසාන සහ තීරණාත්මක බවට ඔහු/ඇය විසින් පිළිගත යුතු වේ.

7. සියලුම පරිවර්තන සහ ප්‍රති-පරිවර්තන හුවමාරුවේ දී LOFC වෙත අලාභයක් නොවන පරිදි සිදු කෙරෙනු ඇති අතර හුවමාරුවේදී සිදුවන සියලුම පාඩු සම්බන්ධයෙන් LOFC හානිපූර්ණය කිරීමට කාඩ්පත් හිමියා මෙමඟින් භාර ගනියි. හුවමාරුවේ දී සිදුවන පාඩු යනුවෙන් අදහස් වන්නේ මුදල් වර්ගවල අනුපාතයන් උච්ඡාවචනය වීම හේතුවෙන් හෝ අදාළ කිසියම් මුදල් වර්ගයක අවප්‍රමාණවීම හේතුවෙන් LOFC හෝ එහි නියෝජිතයින්ට හෝ අතරමැදියන්ට හෝ විඳින්නට සිදුවන පාඩුවකි.

8. ගෙවීම් නියමිත දිනයේදී කාඩ්පත් හිමියාගේ හිඟ ක්‍රෙඩිට් කාඩ්පත් බිල්පත් මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් ප්‍රතිශතයක් හෝ කාඩ්පත් ගිණුම වෙත ගෙවීම සඳහා කාඩ්පත් හිමියා විසින් LOFC සමග පවත්වාගෙන යන ඉතුරුම් ගිණුම් වෙත ඍජු හර කිරීම් නියෝග නිකුත් කළ හැකිය. ස්ථාවර නියෝග ඉටුකළ හැකි පරිදි, නියම කළ පියවීමේ ගිණුමෙහි ප්‍රමාණවත් මුදලක් පවත්වා ගන්නා බවට කාඩ්පත් හිමියා එකඟ වේ. නියම කළ පියවීමේ ගිණුමෙහි ප්‍රමාණවත් මුදලක් පවත්වා නොගතහොත් LOFC විසින් ගාස්තුවක් අය නොකෙරෙන අතර එය කලින් කලට LOFC හි අභිමතය පරිදි වෙනස් වනු ඇත. එවැනි නියෝගවල කිසියම් සංශෝධනයක් වෙතොත් ඊළඟ ගෙවීම් නියමිත දිනට අවම වශයෙන් සති දෙකකට පෙර එය LOFC වෙත ලබා දිය යුතු වේ.

9. මෙම ගිවිසුමෙහි අනෙකුත් ප්‍රතිපාදනවලට අගති විරහිතව කාඩ්පත් හිමියා මාසයකට වැඩි කාලයක් තිස්සේ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටී නම්, කාඩ්පත් ගිණුම පියවීම සඳහා කාඩ්පත් හිමියා පැහැදිලි සහ නිශ්චිත උපදෙස් ලබාදිය යුතු අතර, ඔහුගේ/ඇයගේ පිටත්ව යාමට පෙර කාඩ්පත් මධ්‍යස්ථානය වෙත එවැනි උපදෙස් ලබා දී තිබිය යුතු ය. කාඩ්පත් හිමියා විසින් නිසි ලෙස දැනුම් දී නොමැති නම්, සිය අභිමතය පරිදි කාඩ්පත අවලංගු කිරීමට LOFC විසින් අයිතිය රඳවා ගනියි.

10. කාඩ්පත් හිමියාගේ මරණය සිදුවූ අවස්ථාවක දී පොල්මංකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු හෝ නෛතික නියෝජිතයින් හෝ කාඩ්පත් හිමියාගේ උරුමය ලද ළඟම ඥාතියා කාඩ්පත් ගිණුමෙහි හිඟව පවතින ගෙවිය යුතු සියලුම මුදල් ආපසු ගෙවීමට සහ පියවීමට වගකිව යුතු වනු ඇති බවට කාඩ්පත් හිමියා මෙමඟින් එකඟ වේ.

11. මාසික ගිණුම් ප්‍රකාශන කාඩ්පත් හිමියාගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යවන ලෙස කාඩ්පත් හිමියා සිදු කරන ඉල්ලීමක් LOFC විසින් පිළිගෙන එකඟ වුවහොත්, විද්‍යුත් ප්‍රකාශන සේවාව හෝ වෙනත් සම්ප්‍රේෂණ මාර්ගයක් ඔස්සේ හෝ එවන ලද සියලුම ප්‍රකාශන නිවැරදි සහ අව්‍යාජ බවට පිළිගැනෙන බවට කාඩ්පත් හිමියා එකඟ වේ.

**7. ගාස්තු හා අයකිරීම්**

1. කාඩ්පත සඳහා සම්බන්ධ වීමේ සහ වාර්ෂික ගාස්තුවක් ගෙවීමට කාඩ්පත් හිමියා එකඟ වේ. ගාස්තු ගෙවිය යුතු වන විට කාඩ්පත් ගිණුමෙන් හර කෙරෙනු ඇති අතර, ක්‍රෙඩිට් කාඩ්පතෙහි කල්ඉකුත් වීමේ දිනයට පෙර එක් මාසයක පූර්ව ලිඛිත දැනුම්දීමක් කාඩ්පත් හිමියා විසින් ලබා දී නොමැති නම් එය ආපසු නොගෙවනු ඇත.

2. කාඩ්පත් ගිණුම් ප්‍රකාශනයෙහි පිටපත් සඳහා වන සියලුම හැසිරවීමේ ගාස්තු LOFC විසින් තීරණය කරනු ලබන යම් අනුපාතයක් යටතේ කාඩ්පත් ගිණුමෙන් හර කෙරෙනු ඇත.

3. ගෙවීම් නියමිත දිනයේ දී හෝ ඊට පෙර කාඩ්පත් හිමියා විසින් සමස්ත හිඟ මුදල පියවීම සිදු නොකරන්නේ නම්, අදාළ ගනුදෙනු දිනයන්ගෙන් ආරම්භ වී, කාඩ්පත් ගිණුමෙහි දක්වා ඇති ආකාරයට හිඟ ශේෂය මත දෛනිකව ගණනය කෙරෙන LOFC විසින් තීරණය කරනු ලබන අනුපාතයකට පොලී අය කෙරෙනු ඇත.

4. ප්‍රකාශනයෙහි දැක්වෙන සමස්ත මුදලම ගෙවීම් නියමිත දිනයෙහි දී

2. මෙහි අඩංගු ප්‍රතිපාදන හේතුවෙන් හෝ ඒවා බලාත්මක කිරීම හේතුවෙන් හෝ මේ යටතේ ඊට ඇති අයිතීන් හේතුවෙන් LOFC වෙත සිදුවිය හැකි, විද්‍යුත් වශයෙන් සංක්‍රමණයේ දී දත්ත හානිවීමක් සහ/හෝ වැරදි යොමුවීමක් ද ඇතුළත්ව ඇතිවන යම් වගකීමක්, අලාභ, හානි, පිරිවැය හා වියදම් (නීතිමය හෝ වෙනත්) සම්බන්ධයෙන් LOFC හානි රහිතකර තැබීමට ද හානිපූරණය කිරීමට ද කාඩ්පත් හිමියා භාර ගනියි.

**19. මෙම ගිවිසුමෙහි වෙනස්කම් සිදුකිරීම**

1. කලින් කලට මෙම ගිවිසුමෙහි අඩංගු නීතිරීති හා කොන්දේසි වෙනස් කිරීමට/ ප්‍රතිශෝධනය කිරීමට/ සංශෝධනය කිරීමට LOFC අයිතිය රඳවා ගනියි. කාඩ්පත් හිමියා එවැනි වෙනස් කිරීමක්/ ප්‍රතිශෝධනයක්/සංශෝධනයක් පිළිනොගන්නේ නම්, කාඩ්පත හා අතිරේක කාඩ්පත් ආපසු භාර දීමට සහ පහත දක්වා ඇති ආකාරයට මෙම ගිවිසුම අවසන් කිරීමට ඔහුට/ඇයට නිදහස පවතියි.

**20. දැනුම්දීම්**

1. කාඩ්පත් හිමියා වෙත සියලුම දැනුම් දීම් මුලික කාඩ්පත් හිමියා විසින් LOFC වෙත ලිඛිතව ලබා දී ඇති අවසාන ලිපිනය වෙත තැපෑලෙන් එවනු ලබන අතර, තැපැල් කිරීමෙන් පැය හතළිස් අටක් (48) ඇතුළත එය ගිණුම් හිමියා(හිමියන්) වෙත ලැබෙනු ඇතැයි සැලකෙනු ඇත.

**21. අවසන් කිරීම**

1. LOFC වෙත ලිඛිත දැනුම්දීමක් ලබාදීමෙන්, කාඩ්පත හා අතිරේක කාඩ්පත (කාඩ්පත්) ආපසු භාරදීම සහිතව මෙම ගිවිසුම ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමට කාඩ්පත් හිමියාට හැකිය. මෙම ගිවිසුම යම් අතිරේක කාඩ්පතක් (කාඩ්පත්) භාවිතයට අදාළ වන අවස්ථාවක LOFC වෙත ලිඛිත දැනුම්දීමක් ලබාදීමෙන්, දෙකට කපා වෙන්කරන ලද අතිරේක කාඩ්පත (කාඩ්පත්) ආපසු භාර දීම සමග කාඩ්පත් හිමියා හෝ අතිරේක කාඩ්පත් හිමියා (හිමියන්) විසින් එසේ අතිරේක කාඩ්පත (කාඩ්පත්) භාවිතයට අදාළ වන තාක් දුරට මෙම ගිවිසුම අවසන් කළ හැකිය.

2. පූර්ව දැනුම් දීමක් සහිතව හෝ රහිතව, හේතුවක් සහිතව හෝ රහිතව, කාඩ්පත අවලංගු කිරීම මගින් හෝ එය අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම මගින් හෝ LOFC විසින් මෙම ගිවිසුම අවසන් කළ හැකිය. එසේ අවසන් කිරීමක් සිදුවුවහොත් හැර සහ එසේ සිදුවන තෙක් LOFC විසින් කාඩ්පත් හිමියා වෙත නව කාඩ්පතක් (අලුත් කිරීමේ කාඩ්පත) සපයනු ඇත.

3 කාඩ්පත් හිමියා රට හැර යන්නේ නම් හෝ රැකියාවක් සඳහා සංක්‍රමණය වන්නේ නම් (ඕනෑම අතිරේක කාඩ්පතක් ද ඇතුළත්ව) හෝ කාඩ්පත LOFC වෙත භාරදිය යුතු වේ.

4. මෙම ගිවිසුම අවසන් කිරීමේ දී හෝ කාඩ්පත් හිමියාගේ බුන්වත්භාවය හෝ මරණය සිදුවූ අවස්ථාවක දී, ගනුදෙනුව සිදුකර ඇති නමුත් තවමත් කාඩ්පත් ගිණුමට එකතු කර නොමැති යම් හිඟ කාඩ්පත් ගනුදෙනුවක මුදල ද සමඟ කාඩ්පත් ගිණුමෙහි පවතින සමස්ත හිඟ ශේෂය වහාම LOFC වෙත සම්පූර්ණයෙන් ගෙවිය යුතු වනු ඇත. කාඩ්පත් ගිණුමෙහි පවතින යම් හිඟ මුදලක් පියවීම සඳහා කාඩ්පත් හිමියා හෝ ඔහුගේ බූදලය වගකීමෙන් බැඳෙනු ඇති අතර, එවැනි හිඟ මුදලක් අය කර ගැනීමේ දී දරන්නට සිදුවන සියලු පිරිවැය, ගාස්තු, (නීතිමය ගාස්තු ද ඇතුළත්ව) සහ වියදම් සඳහා LOFC හානිපූරණය කළ යුතුය. එවැනි ගෙවීමක් සිදු කිරීමට තිබිය දී පවතින අනුපාතයන්ට යටත්ව මූල්‍ය ගාස්තු සහ වෙනත් ගාස්තු හා අයකිරීම් අඛණ්ඩව අය කිරීමට LOFC වෙත හිමිකම පවතියි.

9. කිසියම් හෝ කාර්යයක් සඳහා LOFC විසින් විශ්වාසය තබන යම් පරිගණක ප්‍රතිදානයක අව්‍යාජභාවය හෝ නිරවද්‍ය භාවය පිළිබඳව කිසිඳු අවස්ථාවක හබ නොකිරීමට කාඩ්පත් හිමියා මෙමඟින් එකඟ වේ. LOFC හි පූර්ණ අභිමතය පරිදි LOFC විසින් යෝග්‍ය යැයි සිතන පරිදි LOFC විසින් ක්ෂුද්‍රඡායා පටිගත කිරීම හෝ වෙනත් ආකාරයකින් වාර්තාගත කිරීම් කළ හැකි අතර එසේම එවැනි ක්ෂුද්‍රඡායා පට ඕනෑම අවස්ථාවක විනාශ කිරීමට ද හැකිය.

10. කාඩ්පත් නිකුත්කරුවන්ගේ පවතින රටාවන්/සිදුවීම් මත පදනම්ව, සමහර භූගෝලීය කලාප කාඩ්පත් අවදානම් දැඩි කලාප ලෙස සැලකෙන බව කාඩ්පත් හිමියා වටහාගත යුතු වේ. එබැවින්, LOFC විසින් අවදානම් අවම කරගැනීමේ ක්‍රියාමාර්ග ගැනීම පිණිස, කාඩ්පත් හිමියා විදේශගතවීමට බලාපොරොත්තු වන්නේ නම්, ගමන් කිරීමට අපේක්ෂිත රටවල් සහ එම ගමන්වල දින වකවානු LOFC වෙත දැනුම්දීමට කාඩ්පත් හිමියා භාර ගනියි.

11. අදාළ අවස්ථාවන් හිදී, කෙටි පණිවුඩ සේවාව (sms) අන්තර්ජාල බැංකුකරණය හෝ වෙනත් යම් නාලිකාවක් හරහා ලැබෙන කාඩ්පත් ගනුදෙනුවක් පිළිබඳව දැනුම්දීමක් සැකකටයුතු වනවිට කාඩ්පත් හිමියා/හිමියන් ඒ බව LOFC වෙත වහාම දැනුම් දීමට භාරගනියි.

12. සාමාන්‍ය අවදානම් කළමනාකරණ නිරීක්ෂණ කටයුතුවල දී දුරකථනය මඟින් LOFC විසින් සිය අභිමතය පරිදි අහඹු ලෙස යම් විශේෂිත ගනුදෙනුවක් පිළිබඳව තහවුරු කිරීමක් ඉල්ලා සිටිය හැකි බව කාඩ්පත් හිමියා වටහාව ගන්නා අතර, කාඩ්පත් හිමියාගේ උපරිම දැනුමට අනුව එවැනි ඉල්ලීමකට වහාම ප්‍රතිචාර දැක්වීමට එකඟ වෙයි.

13. කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් LOFC විසින් කලින් කලට කාඩ්පත් හිමියා වෙත ලබා දෙනු ඇති පහසුකම්, ප්‍රතිලාභ, හෝ සේවාවන් භාවිතය පාලනය වන සියලුම නීතිරීති සහ කොන්දේසි (වෙනත් නීතිරීති හා කොන්දේසි) මඟින් බැඳී සිටීමට කාඩ්පත් හිමියා එකඟ වන අතර, ඒවා කලින් කලට සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම සිදුවිය හැක.

**17. තොරතුරු හෙළිදරව් කිරීම**

1. LOFC සුදුසු යැයි සිතන ආකාරයට, වෙනත් ක්‍රෙඩිට් කාඩ්පත් සමාගම් වෙත, හෝ බැංකු වෙත සහ නීතියෙන් නියම වන්නේ නම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත කාඩ්පත් හිමියා හෝ අතිරේක කාඩ්පත් හිමියා(හිමියන්) පිළිබඳව හෝ ඔහුගේ/ ඇයගේ/ ඔවුන්ගේ කාඩ්පත් ගිණුම් (ගිණුම්) පිළිබඳ තොරතුරු හෙළි කිරීමට කාඩ්පත් හිමියා LOFC වෙත අවසර දෙයි. කාඩ්පත් හිමියා තවදුරටත් LOFC සමග කාඩ්පත(පත්) භාවිත කිරීමක් නොමැති අවස්ථාවක දී වුවත් මෙම අවසරය බල පැවැත්වෙනු ඇත.

2. කාඩ්පත් හිමියාගේ කාඩ්පත් භාවිතය පිළිබඳ වාර්තා ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යාංශයට සහ/හෝ වෙනත් දේශීය හෝ විදේශීය ණය තොරතුරු කාර්යාංශයකට වාර්තා කිරීමට LOFC ට එහි අභිමතය පරිදි බලය ඇති බවට කාඩ්පත් හිමියා මෙමඟින් කැමැත්ත ප්‍රකාශ කර පිළිගෙන සිටියි.

**18. හානිපූරණය**

1. උපදෙස් ලැබෙන වේලාවෙහි පවතින තත්ත්වයන් නොසලකා, දුරකථන, ටෙලෙක්ස් හෝ ෆැක්ස් මාර්ගයෙන් කාඩ්පත් හිමියා විසින් හෝ ඔහු වෙනුවෙන් ලබා දෙන්නේ යැයි උද්දේශිතව සැලකෙන යම් දැනුම්දීමකට, ඉල්ලීමකට හෝ වෙනත් පණිවුඩයකට අනුකූලව සද්භාවයෙන් ක්‍රියාත්මක කරන ලද උපදෙස් පිළිබඳව LOFC හානිපූරණය කිරීමට කාඩ්පත් හිමියා මෙමඟින් එකඟ වෙයි.

ආපසු ගෙවනු ලැබේ නම් අදාළ ණය සීමාව දක්වා වන හිඟ මුදල් පොලීවලට (මුදල් අත්තිකාරම් සඳහා හැර) යටත් නොවනු ඇත. ගෙවීමට නියමිත අදාළ දිනයේ දී පසුගිය මාසයේ සමස්ත හිඟ මුදල සම්පූර්ණයෙන්ම පියවා ඇත්නම් කාඩ්පත් හිමියාහට උපරිම දින 45ක (අවම දින 15ක) පොලී රහිත සහන කාලයක් භුක්ති විඳිය හැකි වේ.

5. ගෙවීම් නියමිත දිනය වන විට ගෙවිය යුතු අවම මුදල ගෙවීමට කාඩ්පත් හිමියා අපොහොසත් වන්නේ නම්, ප්‍රමාද ගෙවීම් ගාස්තුවක් අය කෙරෙනු ඇති අතර, එය කාඩ්පත් ගිණුමෙන් හර කෙරෙනු ඇත. මෙම අයකිරීම් LOFC විසින් කලින් කලට තීරණය කරනු ඇති වෙනස්වීම්වලට යටත් වේ.

6. කාඩ්පත් හිමියා හෝ වෙනත් යම් පාර්ශ්වයක් විසින් LOFC වෙත නිකුත් කළ හෝ ඉදිරිපත් කළ චෙක්පත් හෝ වෙනත් ගෙවීම් නියෝගයක් හෝ කිසියම් හේතුවක් මත අගරු වන්නේ නම්, LOFC විසින් කාඩ්පත් හිමියාගෙන් ගාස්තුවක් අයකර කාඩ්පත් ගිණුමෙන් හර කරනු ඇත. මෙම ගාස්තුව LOFC විසින් අය කරනු ඇති කිසියම් තැපැල් ගාස්තුවකට අතිරේකව වේ. මෙම අයකිරීම් LOFC විසින් කලින් කලට තීරණය කරනු ඇති වෙනස්වීම්වලට යටත් වේ.

7. LOFC විසින් කලින් කලට තීරණය කර දැනුම් දෙනු ඇති අනුපාතයකට සියලුම මුදල් අත්තිකාරම් මත මුදල් අත්තිකාරම් ගාස්තුවක් සහ/හෝ හැසිරවීමේ ගාස්තුවක් අය කෙරෙනු ඇති අතර, එය කාඩ්පත් ගිණුමෙන් හර කෙරෙනු ඇත. සංචාරක චෙක්පත්, අණකර සහ ටෙලිග්‍රාෆ් හුවමාරු සඳහා කාඩ්පත මඟින් සිදුකළ සියලු ගෙවීම් ද මුදල් අත්තිකාරම් ලෙස සැලකෙනු ඇති අතර, ඉහත කී ගාස්තුවලට යටත් වේ.

8. බිල්පත් කාලසීමාව තුළ යම් අවස්ථාවක දී නියමිත කාඩ්පත් සීමාව ඉක්මවා ගොස් ඇත්නම්, සීමාව ඉක්මවා යාමේ ගාස්තුවක් අය කර එය කාඩ්පත් ගිණුමෙන් හර කෙරෙනු ඇත. සීමාව ඉක්මවා යාමේ ගාස්තුව LOFC විසින් සිය අභිමතය පරිදි කලින් කලට තීරණය කරනු ඇත.

9. මෙම කාර්යය සඳහා ණය සීමාව ඉක්මවා ගොස් ඇත්දැයි ගණනය කිරීමේ දී අයකිරීම් ලෙස කාඩ්පත් ගිණුමෙන් හර කරන ලද කිසියම් මුදලක්ද සලකා බැලෙනු ඇත.

10. ශ්‍රී ලංකාවේ ඉන්ධන අලෙවිසැල් වෙතින් ලබාගත හැකි ඉන්ධන සහ වෙනත් ද්‍රව්‍ය මිලදී ගැනීම් අධිභාරයකට යටත් වන අතර, භාණ්ඩ වටිනාකමින් 2%ක අනුපාතයකින් කාඩ්පත් ගිණුමෙන් හර කෙරෙනු ඇති අතර, LOFC විසින් තීරණය කරනු ඇති අනුපාත වෙනස් කිරීම්වලට යටත් වේ.

11. විකුණුම් මුදල්පතක ඡායාපිටපත් ලබාගැනීම සඳහා වන ගාස්තුවක් LOFC විසින් තීරණය කරනු ඇති අනුපාතයකට කාඩ්පත් ගිණුමෙන් හර කෙරෙනු ඇත.

12. අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසි හෝ නීතිරීති මඟින් නියමකර ඇති ආකාරයට, අදාළ වකවානුවේ පවතින මුද්දර ගාස්තු හෝ වෙනත් ව්‍යවස්ථාපිත ගාස්තු හෝ අයකිරීම්, අතිරේක කාඩ්පත් හිමියන් සඳහා නිකුත් කළ කාඩ්පත් ද ඇතුළත්ව කාඩ්පත මඟින් හෝ වෙනත් අයුරකින් සිදුකළ සෑම ගනුදෙනුවක් සඳහාම කාඩ්පත් ගිණුමෙන් අය කෙරෙනු ඇත.

13. කිසියම් හේතුවක් මත කාඩ්පත ප්‍රතිස්ථාපනය කිරීමක් අවශ්‍ය වන්නේ නම්, කාඩ්පත ප්‍රතිස්ථාපනය කිරීමේ ගාස්තු LOFC විසින් තීරණය කරනු ඇති අනුපාතයකට කාඩ්පත් ගිණුමෙන් හර කෙරෙන අතර මූලික කාඩ්පත් හිමියා වෙත දැනුම් දෙනු ඇත.

14. සියලුම ව්‍යවස්ථාපිත අය කිරීම් කාඩ්පත මඟින් සිදුකළ සෑම ගනුදෙනුවක් සඳහාම කාඩ්පත් ගිණුමෙන් අය කෙරෙනු ඇත. මෙම ව්‍යවස්ථාපිත ගාස්තු කාඩ්පත් හිමියා වෙත පූර්ව දැනුම් දීමකින් තොරව රජය විසින් කලින් කලට සංශෝධනය කළ හැකිය.

15. පියවා නොමැති එක් එක් කාඩ්පත් ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යවස්ථාපිත ගාස්තු, LOFC වෙත ලැබිය යුතු අයකිරීම් සහ ගාස්තු කාඩ්පත් හිමියා විසින් ලබාගෙන ඇති මුදල් අත්තිකාරම්, කාඩ්පත් ගිණුමට බැරවීමට කාඩ්පත් හිමියා විසින් තැන්පත් කරනු ලබන මුදල්වලින් පිළිවෙලින් පළමුවෙන් අඩු කර ගැනෙනු ඇති අතර, කාඩ්පත භාවිතයෙන් සිදුකළ අදාළ ගනුදෙනු සම්බන්ධයෙන් කාඩ්පත් ප්‍රකාශනයෙහි දැක්වෙන හිඟ ශේෂයන් අඩු කිරීම සඳහා යෙදවෙනු ඇත්තේ ඉතිරි මුදල පමණි.

16. LOFC විසින් තීරණය කරනු ඇති අනුපාතයකට වාර්ෂික ගාස්තුවක් කාඩ්පත් හිමියා වෙතින් අය කර ගැනෙනු ඇත.

**8. ගිණුම් ප්‍රකාශනය**

1. කාඩ්පතෙහි මුද්‍රිත නෙරුමෙහි අන්තර්ගත තොරතුරු සටහන්වීමක් හෝ ප්‍රති-නිර්මාණය වීමක් දරණ නිසි ලෙස සම්පූර්ණ කරන ලද අලෙවි කිරීම්, අණකර සහ/හෝ වෙනත් අයකිරීම්, සහ විද්‍යුත් අලෙවිකිරීම් ස්ථානවල දී නිකුත් කළ යම් ඉන්වොයිස් පත්‍ර/මුද්‍රිත පිටපත්හි දක්වා ඇති මුදල්, කාඩ්පත් හිමියා විසින් LOFC වෙත ගෙවිය යුතුව පවතින බවට ගිණුම් හිමියාට එරෙහිව අවසානාත්මක සාධක බවට සැලකීමට LOFC වෙත හිමිකම පවතින බවට කාඩ්පත් හිමියා මෙමඟින් එකඟ වෙයි.

2. LOFC කාඩ්පත් මධ්‍යස්ථානයේ කළමනාකරු විසින් හෝ එම කාර්යය සඳහා කාඩ්පත් මධ්‍යස්ථානයේ කළමනාකරු හෝ LOFC විසින් විශේෂිතව පත් කරන ලද වෙනත් යම් තැනැත්තෙක් විසින් අත්සන් කර සහතික කළ, ලිඛිතව හෝ LOFC හි ලේඛනගත කිරීමේ ආකෘතියකින් ඉදිරිපත් කළ ඕනෑම ගිණුම් ප්‍රකාශනයක් (මාසික ගිණුම් ප්‍රකාශනයට අමතරව), තහවුරු කිරීමට වෙනත් කිසිඳු ලේඛන හෝ වවුචර්පත් රහිතව එහි අන්තර්ගතය සම්බන්ධයෙන් කාඩ්පත් හිමියාට එරෙහිව අවසානාත්මක සාක්ෂියක් ලෙස නීතියෙන් ප්‍රමාණවත් වනු ඇති බවට කාඩ්පත් හිමියා මෙමඟින් එකඟ වෙයි. මෙම ගිණුම් ප්‍රකාශන කාඩ්පත් ගනුදෙනු, අයකිරීම්, ව්‍යවස්ථාපිත ගෙවීම් හෝ ටෙලර් යන්ත්‍ර මඟින් සිදුකළ මුදල් ආපසු ලබාගැනීම් දැක්වෙන ලේඛනවල ආකෘතිවලින් හෝ, LOFC හි පොත්, පරිගණක වාර්තා, ලේඛන හා මතක ගබඩා උපාංග මඟින් සැකසූ ප්‍රකාශනවල ආකෘතියෙන් යුක්ත විය හැකි බවට කාඩ්පත් හිමියා එකඟ වෙයි. LOFC විසින් සපයන ලද එවැනි ඕනෑම ලේඛනයක් එහි දක්වා ඇති මුදල් කාඩ්පත් හිමියා විසින් LOFC වෙත ගෙවිය යුතුව පවතින බවට ගිණුම් හිමියාට එරෙහිව අවසානාත්මක සාධක බවට ද, අධිකරණයක දී සාක්ෂි ලෙස පිළිගත හැකි බවටද සැලකීමට කාඩ්පත් හිමියා වැඩිදුරටත් එකඟ වෙයි.

3. අලෙවි ස්ථානවල ස්ථාපිත යන්ත්‍ර මඟින් සිදු කළ කාඩ්පත් ගනුදෙනු දැක්වෙන සහ අන්තර්ජාල ගනුදෙනු මෙන්ම ටෙලර් යන්ත්‍ර මඟින් හෝ 2006 අංක 19 දරණ විද්‍යුත් ගනුදෙනු පනතෙහි ප්‍රතිපාදන මඟින් අර්ථ දක්වා ඇති ආකාරයට වෙනත් ඕනෑම විද්‍යුත් මාධ්‍යයක් මඟින් සිදුකල මුදල් ආපසු ලබාගැනීම් ද දැක්වෙන කිසියම් ගිණුම් ප්‍රකාශනයක, උධෘතයක, ලේඛනයක හෝ ඉහත දක්වා ඇති වෙනත් යම් ලේඛනයක අන්තර්ගත වන ඕනෑම තොරතුරක් කාඩ්පත් හිමියන් පිළිගත යුතු වන බවට කාඩ්පත් හිමියා මෙමඟින් එකඟ වෙයි.

**9. අතිරේක කාඩ්පත්**

1. අතිරේක කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත භාවිතය, අදාළ අවස්ථාවල දී මෙම ගිවිසුමෙහි අඩංගු නීතිරීති හා කොන්දේසි මඟින් බැඳී සිටීමට සහ පාලනය වීමට යටත්ව LOFC හි අභිමතය මත, කාඩ්පත් හිමියාගේ ඉල්ලීම මත LOFC විසින් මූලික කාඩ්පත් හිමියාගේ සමීපතම ඥාතීන් වෙත අතිරේක කාඩ්පත(පත්) නිකුත් කරනු ඇත. මූලික කාඩ්පත් හිමියා විසින් ඔහුගේ /ඇයගේ අභිමතය පරිදි එක ම ණය සීමාව හෝ අඩු ණය සීමාවක් අතිරේක කාඩ්පත් හිමියා වෙත නියම කරනු ඇත. අතිරේක කාඩ්පත මඟින් සිදුකළ කාඩ්පත් ගනුදෙනු සහ මුදල් ආපසු ගැනීම් වියදම් සහ හිඟ මුදල් පොලිය ද සමඟ, සම්පූර්ණ හානිපූරණ පදනමින් LOFC වෙත ඔහු/ඇය විසින් ගෙවිය යුතු බව කාඩ්පත් හිමියා පිළිගනියි.

**16. පොදු**

1. කාඩ්පත් හිමියා රැකියාවේ සහ/හෝ ඔහුගේ/ඇයගේ කාර්යාල හෝ නේවාසික ලිපිනය හා දුරකථන අංකවල වෙනස්වීමක් ඒ පිළිබඳ ලේඛනගත සාධක ද සහිතව වහාම ලිඛිතව LOFC කාඩ්පත් මධ්‍යස්ථානය වෙත දැනුම්දිය යුතුය. කාඩ්පත් ගිණුමෙහි පවතින හිඟ මුදල සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් මාරුකිරීමට හෝ වෙනත් ඕනෑම ආකාරයකින් නියම කිරීමට LOFC වෙත එහි පූර්ණ අභිමතය පරිදි අයිතිය පවතිනු ඇත.

2. මූලික කාඩ්පත් හිමියාගේ ලිඛිත ඉල්ලීම මත, LOFC විසින් එහි අභිමතය පරිදි ඔහුගේ/ඇයගේ ක්‍රෙඩිට් කාඩ්පත උසස් කිරීම සහ/හෝ ඔහුගේ/ඇයගේ ණය සීමාව ඉහළ දැමීම සිදු කළ හැකිය.

3. 'හිඟ මුදල් එකතු කිරීමට තුන්වන පාර්ශ්වයක එකතු කිරීමේ නියෝජිතයන් පත්කිරීමට LOFC වෙත කාඩ්පත් හිමියා මෙමඟින් බලය ලබාදෙයි. පොලිය, නීති ගාස්තු හා අවශ්‍ය නම් එකතු කිරීමේ නියෝජිතයෙකු වෙත යොමුකිරීමට වැය වන එකතු කිරීමේ නියෝජිත ගාස්තු ගෙවීම් අය කරගැනීමට නඩු පැවරීමේ ගාස්තු ද සහිතව හිඟ මුදල් එකතු කරගැනීමේ පිරිවැය කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතු වේ.

4. LOFC විසින් ඉල්ලා සිටින ඕනෑම මොහොතක කාඩ්පත් හිමියා ඔහුගේ/ඇයගේ මූල්‍යමය තත්ත්වය සම්බන්ධයෙන් දත්ත සැපයිය යුතු ය. එසේ සපයන තොරතුරු තහවුරු කරගැනීමට ද කාඩ්පත් හිමියා LOFC වෙත වැඩිදුරටත් අවසර දී සිටියි. ඉල්ලූ විටෙක අදාළ තොරතුරු නොසපයන විට කාඩ්පත අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ යෝග්‍ය යැයි සලකන්නේ නම්, කාඩ්පත වහාම අවලංගු කිරීමට ද LOFC හට හැකිය. එසේ අවලංගු කල අවස්ථාවක සමස්ත හිඟ මුදල කාඩ්පත් හිමියා විසින් LOFC වෙත වහාම ගෙවිය යුතු වේ.

5. LOFC හි ලිපි ආපසු ලැබෙන විට සහ කාඩ්පත් හිමියා සම්බන්ධ කරගැනීමට නොහැකි වනවිට, අයදුම්පතෙහි සඳහන් කර ඇති වෙනත් ලිපිනයක් වෙත කාඩ්පත් හිමියාගේ ප්‍රකාශනය සහ/හෝ ලිපි ගනුදෙනු යොමුකිරීමට LOFC අයිතිය රඳවා ගනියි.

6. කාඩ්පත් හිමියා වෙත දැනුම්දීමක් සහිතව හෝ රහිතව, මුලින් ලබා දුන් ණයවර සීමාව අඩුකිරීමට සහ/හෝ කාඩ්පත් ගිණුම අසතුටුදායක ලෙස පවාත්වා ගැනීම මත කාඩ්පත අලුත් කිරීම නතර කිරීමට ද LOFC අයිතිය රඳවා ගනියි.

7. මෙම ගිවිසුමෙහි සපයා ඇති අයිතිවාසිකම් සහ ප්‍රතිකර්ම සමුච්චිත වන අතර (නීතියෙන් හෝ වෙනත් අයුරකින් සපයා ඇති) වෙනත් අයිතිවාසිකම් හෝ ප්‍රතිකර්ම බැහැර නොකෙරේ. කාඩ්පත් හිමියා විසින් කිසියම් ගනුදෙනු/වක් පිළිබඳ හබ කරන්නේ නම්, LOFC විසින් එවැනි ගනුදෙනු සම්බන්ධයෙන් පරීක්ෂා කරනු ඇත. කෙසේ වුවද, කාඩ්පත් හිමියා නීතිමය පියවර අනුගමනය කිරීමට කැමති නොවන්නේ නම් හෝ එම පරීක්ෂණ සඳහා සහයවීමට LOFC වෙත නොපැමිණෙන්නේ නම් හෝ සංවෘත පරිපථ රූපවාහිනී (CCTV) දර්ශන සහ වෙනත් සාක්ෂි නිරීක්ෂණය කිරීමට කැමති නොවන්නේ නම් හෝ පරීක්ෂණ ක්‍රියාදාමයේ දී අලෙවිසැල් හෝ ATM යන්ත්‍ර වෙත යාමට කැමති නොවන්නේ නම් හෝ, හබ කළ සියලුම ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියා වගකීමට ලක් වනු ඇත.

8. කාඩ්පත් හිමියාට, යම් කාඩ්පත් ගනුදෙනුවකට, කාඩ්පත් සහ/හෝ කාඩ්පත් ගිණුමට අදාළ සියලුම කාරණා සම්බන්ධයෙන් හි LOFC හි වාර්තා එම කරුණු සම්බන්ධයෙන් අවසානාත්මක සාක්ෂි වනු ඇති අතර, එමඟින් සියලුම කාර්යයන් සඳහා කාඩ්පත් හිමියා බැඳීමට ලක් වනු ඇත.

විසින් රඳවා ගනියි. කිසියම් අවස්ථාවකදී මෙම අරමුදල්වලට ප්‍රවේශ වීමට කාඩ්පත් හිමියා කැමැත්තෙහි නම් ඔහු/ඇය විසින් LOFC වෙත කල් තබා දැනුම් දිය යුතු අතර, කාඩ්පත් හිමියාගේ ණයවර චර්යාව මත පදනම්ව LOFC විසින් ඒ සම්බන්ධයෙන් තීරණය කරනු ඇත.

3. කාඩ්පත් ගිණුම මත කාඩ්පත් හිමියා වෙතින් LOFC වෙත ගෙවිය යුතුව ණය වී පවතින යම් මුදලක් අය කර ගැනීම සඳහා කාඩ්පත් හිමියා විසින් LOFC හි ඕනෑම ශාඛාවක පවත්වාගෙන යන ඉතුරුම් ගිණුමක බැර වී පවතින යම් මුදලක් මඟින් පියවා ගැනීමටද, LOFC හි ඕනෑම ශාඛාවක පවත්වාගෙන යන ඕනෑම ගිණුමක තැන්පත් කර ඇති හෝ ඊට බැර කර ඇති ඕනෑම මුදලකින් කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතුව ණය වී පවතින සම්පූර්ණ මුදල දක්වා අයකර ගැනීමට සහ කාඩ්පත් හිමියා විසින් LOFC හි තබා ඇති යම් තැන්පතුවක් ආපසු ලබාගැනීමට හෝ කාඩ්පත් ගිණුමෙහි හිඟ මුදල සම්පූර්ණයෙන් පියවන තෙක් එවැනි යම් තැන්පතුවක් ලියමක් ලෙස තබා ගැනීමටද කාඩ්පත් හිමියා මෙමඟින් LOFC වෙත අවසර දෙයි.

4. කාඩ්පත් ගිණුම මත කාඩ්පත් හිමියා වෙතින් LOFC වෙත ගෙවිය යුතුව ණය වී පවතින යම් මුදලක් අයකර ගැනීම සඳහා කාඩ්පත් හිමියා විසින් LOFC වෙත සුරක්ෂිතයක් ලෙස තබා ඇති යම් වත්කමක් රඳවා තබා ගැනීමට සහ එයින් අය කර ගැනීමට LOFC වෙත හිමිකම පවතින බවට සහ එසේ ගන්නා ලද යම් පියවරක් සම්බන්ධයෙන් කාඩ්පත් හිමියා විසින් LOFC හානිපූරණය කරනු ඇති බවට ද කාඩ්පත් හිමියා මෙමඟින් පිළිගෙන එකඟ වෙයි.

5. මෙම නීතිරීති සහ කොන්දේසි යටතේ LOFC වෙත පවතින වගකීම් පියවීමට කාඩ්පත් හිමියා අපොහොසත් වන අවස්ථාවක දී හෝ මෙම ගිවිසුමෙහි නීතිරීති හා කොන්දේසි අනුව ක්‍රියා කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී LOFC විසින් සිය පූර්ණ අභිමතය පරිදි ඒක පාර්ශ්විකව මෙම ගිවිසුම අවසන් කිරීමට සහ මෙම ගිවිසුම යටතේ කාඩ්පත් හිමියා වෙත නිකුත් කළ සියලුම කාඩ්පත් (අතිරේක කාඩ්පත් ද ඇතුළත්ව) අවලංගු කිරීමටද හැක. කාඩ්පත් හිමියාගේ පැහැර හැරීමක් මත LOFC විසින් මෙම ගිවිසුම අවසන් කරන අවස්ථාවකදී කාඩ්පත් හිමියා/හිමියන් LOFC සමග කිසිදු නව කාඩ්පත් ගිවිසුමකට ඇතුළත් වීමට සුදුසුකම් නොලබන අතර, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය වෙත වාර්තා කරනු ලැබේ.

6. මෙම නීතිරීති සහ කොන්දේසි යටතේ LOFC වෙත පවතින වගකීම් පියවීමට කාඩ්පත් හිමියා අපොහොසත් වන අවස්ථාවක දී කාඩ්පත් හිමියා හමුවීමට සහ කාඩ්පත් ගිණුම මත කාඩ්පත් හිමියා විසින් ගෙවිය යුතුව ණය වී පවතින හිඟ මුදල් LOFC වෙත ගෙවන ලෙස කාඩ්පත් හිමියා පෙළඹවීමට ද අය කරගැනීමේ නියෝජිතයන් ලෙස තෙවන පාර්ශවයක්, ස්වාධීන කොන්ත්‍රාත්කරුවන්ගේ සේවාව ලබාගැනීමට ද, එම කාර්යය සඳහා ගනුදෙනු සහ හිඟ මුදල්වලට අදාළ අවශ්‍ය ණයවර තොරතුරු එම තෙවන පාර්ශ්වය වෙත, ස්වාධීන කොන්ත්‍රාත්කරුවන් වෙත හෙළිදරව් කිරීමට කාඩ්පත් හිමියා LOFC වෙත අවසර දී සිටියි. කාඩ්පත් ගිණුම මත හිඟ ව පවතින මුදල් ගෙවීම කාඩ්පත් හිමියා අඛණ්ඩව පැහැර හරින්නේ නම්,

7. කාඩ්පත් ගිණුම මත හිඟව පවතින මුදල් ගෙවීම කාඩ්පත් හිමියා අඛණ්ඩව පැහැර හරින්නේ නම්, කාඩ්පත් ගිණුම මත හිඟ වී පවතින සමස්ත මුදල අය කර ගැනීමට මූලික කාඩ්පත් හිමියාට (අතිරේක කාඩ්පත් හිමියෙකු සිටින අවස්ථාවක දී අතිරේක කාඩ්පත් හිමියා සමග එක්ව හෝ වෙන් වෙන්ව) එරෙහිව නීතිමය පියවර ගැනීමට හිමිකම පවතින බව කාඩ්පත් හිමියා පිළිගනියි.

8. එකතු කිරීමේ නියෝජිත ආයතනයක් වෙත ගැටලුව යොමුකිරීමට හෝ ගෙවීම් බලාත්මක කරවාගැනීමට හෝ නීතිමය පියවර ගැනීමට අවශ්‍ය වන්නේ නම්, හිඟ මුදල් එකතු කරගැනීමේ සියලු පිරිවැය, නෛතික කාඩ්පත් ගිණුමෙන් හර කෙරෙනු ඇති අතර, මූලික කාඩ්පත් හිමියා වෙත යැවෙන මාසික ගිණුම් ප්‍රකාශනයෙහි දැක්වෙනු ඇති අතර, අතිරේක කාඩ්පත් හිමියා වෙත වෙනම ගිණුම් ප්‍රකාශනයක් ලබා නොදෙනු ඇත.

2. මූලික කාඩ්පත් හිමියා හා අතිරේක කාඩ්පත් හිමියා අතිරේක කාඩ්පත භාවිතය මඟින් ඇතිවන යම් අයකිරීමක් සඳහා LOFC වෙත එක්ව සහ/හෝ වෙන් වෙන්ව වගකිව යුතු වනු ඇත. සම්පූර්ණ මුදලම හෝ ඉන් කොටසක් හෝ අතිරේක කාඩ්පත් හිමියා විසින් වැයකර තිබුණ ද කාඩ්පත් ගිණුමෙහි දැක්වෙන සම්පූර්ණ හිඟ මුදල සඳහා මූලික කාඩ්පත් හිමියා, මූලික ණයගැතියා ලෙස වගකිව යුතු වනු ඇති අතර, මූලික කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා අතර සම්බන්ධතාව අවසන්වීම නොතකා LOFC වෙත ගෙවිය යුතු වන මුදල් හිඟව පවතින තාක් මූලික කාඩ්පත් හිමියාගේ වගකීම අඛණ්ඩව පවතිනු ඇත.

3. අතිරේක කාඩ්පත නිකුත් කළ පසුව, මූලික කාඩ්පත් හිමියා විසින් හෝ අතිරේක කාඩ්පත් හිමියා විසින් කාඩ්පත් මධ්‍යස්ථානය වෙත කරන ලිඛිත දැන්වීමක් මඟින් එය අවලංගු කරන තෙක් එය බලාත්මකව පවතිනු ඇත.

4. මෙම ගිවිසුම සහ මූලික කාඩ්පත භාවිතය අවසන්වීමේ දී සියලු අතිරේක කාඩ්පත් භාවිතය ද අවසන් වනු ඇති අතර, අතිරේක කාඩ්පත/කාඩ්පත් LOFC වෙත වහාම ආපසු භාරදිය යුතු වනු ඇත.

5. මූලික කාඩ්පත් හිමියාට සහ අතිරේක කාඩ්පත් හිමියාට ඒකාබද්ධ ණය සීමාවක් අදාළ වනු ඇත; ඔවුන් විසින් පිළිවෙලින් වැය කරන පවතින ශේෂය ඒකාබද්ධ ණය සීමාව ඉක්මවා යන ආකාරයෙන් මූලික කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා විසින් කාඩ්පත් ගනුදෙනු සිදු නොකළ යුතු ය.

6. මෙම ගිවිසුම යටතේ මූලික කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියා විසින් අප වෙත ගෙවිය යුතු සියලු භාරගැනීම්, වගකීම් සහ බැඳීම්, මූලික කාඩ්පත් හිමියා සහ අතිරේක කාඩ්පත් හිමියාට එකිනෙකාට එරෙහිව පවතිනු ඇති යම් මතභේදයක් හෝ ප්‍රතියාචනයක් හෝ පියවීමේ අයිතියක් මඟින් කිසිදු ආකාරයකින් බලපෑමට ලක් නොවනු ඇත.

## 10. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සහ රහස්‍ය අංකය භාවිතය

1. ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් මුදල් ලබාගැනීම සිදුකළ හැකි පරිදි කාඩ්පතට ATM පහසුකම් ලබා දී ඇති විට එම පහසුකම් භාවිත කිරීම ඉලෙක්ට්‍රොනික් යන්ත්‍රවල කාඩ්පත භාවිත කිරීම පාලනය වන LOFC හි සහ මාස්ටර් කාඩ් ගිවිසුමට සහ විනිමය පාලන පනතට යටත් වේ.

2. ATM යන්ත්‍ර මඟින් ක්‍රෙඩිට් කාඩ්පත් හිමියා සිදු කරන ගනුදෙනු සම්බන්ධයෙන් ඇති වන ඕනෑම ආරවුලක් LOFC විසින් පරීක්ෂා කරනු ඇති අතර, LOFC සෑහීමකට පත්වන පරිදි වෙනත් අන්දමකට ඔප්පු නොවුවහොත් එම ගනුදෙනු කාඩ්පත් හිමියාගේ වගකීමක් වනු ඇත.

3. ATM ගනුදෙනුවල දී කාඩ්පත් හිමියා විසින් අදාළ ගනුදෙනුවලට අවසර දී ඇති බවට LOFC හි පරිගණක පද්ධතියේ තොරතුරු අවසානාත්මක සාධකයක් වනු ඇත.

4. කාඩ්පත් හිමියාගේ අවසරය සහිතව හෝ රහිතව කාඩ්පත භාවිතයෙන් ATM යන්ත්‍ර මඟින් සිදුකරන ලද සියලු ගනුදෙනු සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු වනු ඇත. ATM ගනුදෙනුවක් සඳහා පෞද්ගලික හඳුනාගැනීමේ අංකයක් (PIN) භාවිත කළ යුතු හෙයින් කාඩ්පතක් නැතිවීම පිළිබඳ වාර්තා කිරීමක් මඟින් මෙම වගකීම අත්හිටුවීමක් හෝ අවලංගුවීමක් සිදු නොවනු ඇත. පුද්ගලික හඳුනාගැනීමේ අංකය ආරක්ෂා කිරීමට, රැක ගැනීමට හා කාඩ්පතෙන් වෙන්ව තබාගැනීමට විශේෂයෙන්ම කාඩ්පත් හිමියන් වෙත උපදෙස් දී ඇති අතර, එසේ කටයුතු කිරීමට

අපොහොසත් වීම වැනි අවස්ථාවක දී මතුවන ඕනෑම වගකීමක් භාර ගැනීම කාඩ්පත් හිමියා විසින් පිළිගත් බවට සැලකේ. කාඩ්පත් හිමියා විසින් ATM යන්ත්‍රයක් මඟින් කාඩ්පත් ගිණුමෙන් මුදල් ලබාගෙන ඇති අවස්ථාවක LOFC විසින් ඒ අනුව කාඩ්පත් ගිණුම හර කරනු ඇත.

5. මූලික කාඩ්පත් හිමියාගේ ඉල්ලීම මත අතිරේක කාඩ්පත් නිකුත් කර ඇති අවස්ථාවක දී ATM යන්ත්‍ර හරහා කාඩ්පත භාවිත කිරීම සඳහා වන අය කිරීම් සඳහා අතිරේක කාඩ්පත් හිමියන් ද සමග කාඩ්පත් හිමියා බැංකුව වෙත එක්ව සහ වෙන් වෙන්ව වගකිව යුතු වේ. කාඩ්පත් හිමියාට සිය කාඩ්පත් ගිණුමෙන් මුදල් ලබාගැනීම සඳහා සහ කාඩ්පත් හිමියාගේ ක්‍රෙඩිට් කාඩ්පත් ගිණුමෙන් ATM යන්ත්‍ර හරහා පිරිනමන සියලුම පහසුකම් ලබාගැනීම සඳහා කාඩ්පත භාවිත කළ හැක.

6. කාඩ්පත් හිමියාගේ කාඩ්පත් ගිණුමෙහි සියලුම ගනුදෙනු පිළිබඳ LOFC හි වාර්තා, සියලුම කාර්යයන් සඳහා කාඩ්පත් හිමියා මත අවසානාත්මක සහ බන්ධනීය වන බවට කාඩ්පත් හිමියා එකඟ වෙයි.

7. කාඩ්පතෙහි චුම්භක පටියෙහි අඩංගු කාඩ්පත් දත්ත සහ/හෝ චිපයෙහි අඩංගු කාඩ්පත් දත්තවල ආරක්ෂාව සහතික කර ගැනීම සඳහා කාඩ්පත් හිමියා විසින් හැකි සියලු ප්‍රයත්නයන් දැරිය යුතු වන අතර, රහස්‍ය අංකය හෝ වෙනත් යම් කාඩ්පත් දත්තයක් වෙනත් තැනැත්තෙකු දැනගැනීම වැළැක්විය යුතු වේ.

**11. මුදල් අත්තිකාරම්**

1. කාඩ්පත් හිමියා විසින් ATM යන්ත්‍ර හෝ LOFC ශාඛා මඟින් හෝ මුදල් නිකුත් කිරීමේ වෙළඳ මහතුන් හෝ නියෝජිතයන් මඟින් ලබාගන්නා මුදල් අත්තිකාරම්, ATM යන්ත්‍ර, මධ්‍යමම කාඩ්පත් නිකුත්කරන්නා, වෙළඳ, නියෝජිත, දේශීය හෝ විදේශීය සීමාවන්ට සහ සීමා කිරීම්වලට යටත් වනු ඇත. මධ්‍යම කාඩ්පත් නිකුත් කරන්නාගේ සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසිද අදාළ වනු ඇත. ඉහත මුදල් අත්තිකාරම් සීමාව/සීමාවන් ඔබ වෙත දන්වා තිබුණද නොතිබුණද අප විසින් තීරණය කරනු ලබන සීමාවක් දක්වා ඔබ විසින් මුදල් අත්තිකාරම් ලබා ගත හැකිය. කාඩ්පත් හිමියා වෙත පූර්ව දැනුම් දීමකින් තොරව මෙම පහසුකම වෙනස් කිරීම හෝ ඉවත් කර ගැනීම කාඩ්පත් නිකුත් කරන්නා විසින් සිදුකළ හැක.

**12. කාඩ්පත සහ රහස්‍ය අංකය (PIN) ආරක්ෂා කරගැනීම**

1. කාඩ්පතෙහි ආරක්ෂාව සහතික කරගැනීම සඳහා කාඩ්පත් හිමියා විසින් හැකි සෑම පියවරක්ම ගත යුතු අතර, වෙනත් යම් තැනැත්තෙකු විසින් රහස්‍ය අංකය දැනගැනීම වැළැක්විය යුතු වන අතර, රහස්‍ය අංකය (PIN) කිසිඳු ආකාරයකින් ලියා නොතබන බවට ද සහතික විය යුතුය.

**13. වගකීම/ කාඩ්පත නැතිවීම**

1. කාඩ්පත නැතිවීමක්/සොරකම් කිරීමක්/විනාශ කිරීමක් හෝ වෙනත් යම් හේතුවක් මත අවභාවිත වීමේ හැකියාවක් ඇත්නම් හෝ රහස්‍ය අංකය වෙනත් අයෙකුට හෙළිදරව් වී ඇත්නම් කාඩ්පත් හිමියා වහාම එම නැතිවීම හෝ සොරකම් කිරීම හෝ හෙළිදරව් වීම පිළිබඳව පොලිසියට දැනුම් දිය යුතු අතර, කාඩ්පත් මධ්‍යස්ථානය වෙතද දැනුම්දිය යුතුය. එම දැනුම් දීම වාචිකව ලබා දී ඇත්නම්, එය කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ලිඛිතව තහවුරු කරන තෙක් බලාත්මක නොවනු ඇත.

2. එකී ලිඛිත දැනුම් දීම කාඩ්පත් මධ්‍යස්ථානය වෙත ලැබෙන තෙක් කාඩ්පත භාවිත කිරීම් සඳහා, සියලුම කාඩ්පත් ගනුදෙනු සඳහා සහ මුදල් ආපසු ගැනීම් සඳහා කාඩ්පත් හිමියා වගකිව යුතු වන අතර, එම සියලුම මුදල් මෙම ගිවිසුමෙහි දක්වා ඇති ආකාරයට කාඩ්පත් හිමියා වෙතින් අය කර ගැනෙනු ඇත.

3. කාඩ්පත නැතිවීම හෝ අවභාවිතයට හෝ රහස්‍ය අංකය හෙළිදරව් වීමට අදාළ වාතාවරණය පිළිබඳව කාඩ්පත් හිමියා විසින් කාඩ්පත් හිමියා සතුව පවතින සියලුම තොරතුරු LOFC වෙත සපයා දිය යුතු අතර, නැතිවූ කාඩ්පත් සොයාගැනීම සඳහා සහාය වීමට LOFC විසින් අවශ්‍ය යැයි සලකන සියලුම පියවර ගත යුතු අතර, පොලිසිය වෙත ගොනු කළ ප්‍රකාශයේ සහතික පිටපතක් සපයා දිය යුතුය.

4. LOFC විසින් සිය පූර්ණ අභිමතය පරිදි නැතිවූ හෝ සොරකම් කරන ලද කාඩ්පතක් වෙනුවට මූලික කාඩ්පතට සමාන නීතිරීති හා කොන්දේසි යටතේ ගාස්තුවට යටත්ව ප්‍රතිස්ථාපන කාඩ්පතක් නිකුත් කළ හැකිය.

5. නැතිවූ හෝ සොරකම් කළ කාඩ්පත කාඩ්පත් හිමියාහට නැවත හමුවූ විට, කාඩ්පත් හිමියා එසේ සොයාගත් කාඩ්පත වහාම කාඩ්පත් මධ්‍යස්ථානය වෙත භාරදිය යුතුය.

**14. නිදහස් කිරීම් සහ බැහැර කිරීම්**

1. කිසියම් වෙළඳ ආයතනයක් විසින් කාඩ්පත ගරු කිරීමට හෝ පිළිගැනීමට හෝ ණය පහසුකම් සම්පූර්ණ හා අවසරලත් ණය සීමාව දක්වා ලබා දීමට සහ වෙනත් බැංකුවක දී සිදු කරන මුදල් අත්තිකාරම් ගැනීමකදී සහ මුදල් ගැනීමකදී ණය පහසුකම් සම්පූර්ණ හා අවසරලත් ණය සීමාව දක්වා ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් LOFC කිසිඳු වගකීමකට ලක් නොවන බවට කාඩ්පත් හිමියා එකඟ වේ.

2. කාඩ්පත හෝ කාඩ්පත් අංකය භාවිතයෙන් මිලදී ගන්නා ලද භාණ්ඩ හෝ සේවාවල ඇති කිසියම් අඩුපාඩුවක් සම්බන්ධයෙන් LOFC වගකීමට බැඳී නොසිටී. LOFC වෙත ගෙවීම් වැළැක්වීමකින් තොරව, ආයතන හෝ අලෙවිකරුවන් සමග ඇතිවන ආරවුල් හෝ අයැදීම් කාඩ්පත් හිමියා සහ අදාළ වෙළඳ ආයතනය හෝ අලෙවිකරු සහ/හෝ බැංකුව සමග විසඳා ගත යුතු වේ.

3. කිසියම් යන්ත්‍රයක හෝ දත්ත සැකසුම් පද්ධතියක හෝ විද්‍යුත් සම්ප්‍රේෂණ පද්ධතියක හෝ සම්බන්ධතාවක බිඳවැටීමක් හෝ කාර්මික ආරවුලක් හේතුවෙන් හෝ LOFC හි සහ එහි සේවකයන්ගේ පාලනයෙන් බැහැර ඕනෑම දෙයක් හෝ හේතුවක් නිසා මෙම ගිවිසුම යටතේ වන ස්වකීය වගකීම් ඉටුකිරීමට LOFC අපොහොසත් වුවහොත් කාඩ්පත් හිමියා ඒ සඳහා LOFC වගකීමට ලක් නොකළ යුතු වේ.

4. සෘජුව හෝ වක්‍ර ලෙස යම් යන්ත්‍රයක හෝ සන්නිවේදන පද්ධතියක බිඳවැටීම හේතුවෙන්, ස්වභාවික විපතක් හේතුවෙන්, කාර්මික ආරවුලක් හෝ, කිසියම් හේතුවක් නිසා ගිණුම් ප්‍රකාශන යැවීමට නොහැකිවීම ද ඇතුළත්ව එහි පාලනයෙන් බැහැර ඕනෑම හේතුවක් නිසා මෙම ගිවිසුම යටතේ ඉටුකළ යුතු ස්වකීය බැඳීම් ඉටුකිරීමට නොහැකි වන අවස්ථාවක දී ඒ සඳහා LOFC වගකීමට ලක් නොවනු ඇති අතර, කාඩ්පත් හිමියාගේ වගකීම් අගතියට පත් නොවනු ඇති අතර අඛණ්ඩව පවතිනු ඇත.

**15. අය කර ගැනීම්**

1. ගෙවීම් නියමිත දිනයට මෙම නීතිරීති සහ කොන්දේසි යටතේ LOFC වෙත ඔහුගේ/ඇයගේ වගකීම් පියවීමට කාඩ්පත් හිමියා අපොහොසත් වුවහොත් ඕනෑම අවස්ථාවක කාඩ්පත් හිමියා වෙත දැනුම්දීමකින් තොරව කාඩ්පත් හිමියා විසින් LOFC හි ඕනෑම ශාඛාවක පවත්වාගෙන යන යම් ඉතුරුම් ගිණුමක් හෝ වෙනත් ආකාරයක ගිණුමක් හර කිරීමට LOFC වෙත අයිතිය පවතින බවට කාඩ්පත් හිමියා විශේෂිතවම එකඟ වෙයි.

2. කාඩ්පතක් සපයන අවස්ථාවේ දී සුරක්ෂිතයක් ලෙස LOFC ගිණුමක මුදල් තැන්පත් කරන ලෙස LOFC විසින් කාඩ්පත් හිමියාට නියම කළ හැකිය. කාඩ්පත් හිමියා වෙත දැනුම් දීමක් සහිතව හෝ රහිතව මෙම බැර ශේෂයන්ට එරෙහිව කාඩ්පත් හිඟ මුදල් පියවීමේ අයිතිය LOFC